

PGIHS
UNIVERSITY OF PERADENIYA

# 2019 ANNUAL REPORT

POSTGRADUATE INSTITUTE OF HUMANITIES AND SOCIAL SCIENCES





**PGIHS**
**UNIVERSITY OF PERADENIYA**

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT

# 2019

**මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**

மனிதப் பண்பியல் மற்றும் சமூக விஞ்ஞானக் கற்றைகளுக்கான பட்ட மேற்படிப்பு நிறுவகம்
பேராதனைப் பல்கலைக்கழகம்

Postgraduate Institute of Humanities and Social Sciences
University of Peradeniya

[illegible] ක්ෂේත්‍රය තුළ පශ්චාත් උපාධි අධ්‍යාපනයේ [illegible] වශයෙන් මෙරට පුරෝගාමියා වීම සහ ඉගෙනුම් [illegible] විශිෂ්ටතා [illegible] පත්වීම

[illegible] දැනුම, කුසලතාවය සහ ප්‍රවීණත්වයෙන් සපිරි සමාජ [illegible] පර්යේෂකයින් සහ වෘත්තිකයන් බිහිකිරීමේ අරමුණින් [illegible] යුතු උපාධි අධ්‍යාපනයක් පිරිනැමීම

## හර පද්ධතීන්

සම අවස්ථා

ශාස්ත්‍රීය සමායෝජනය සහ වෘත්තීයභාවය

තාර්කික ලෙස දැනුම ලබාගැනීම

සමාජ සංවේදීභාවය සහ අන්‍යෝන්‍ය ගරුත්වය


විවිධත්වය සහ අදහස් ප්‍රකාශකිරීමේ නිදහසට ගරුකිරීම

ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ අදහස් ප්‍රකාශකිරීමේ නිදහසට ගරුකිරීම

*අන්තර්ගතය* *පිටු අංක*


| | | |
|---|---|---|
| සංවිධාන ව්‍යුහය | | 1 |
| කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය | | 3 |
| 1 වෙනි කොටස: | 2019 වර්ෂය සඳහා ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය / සමාලෝචනය | 5 |
| 2 වෙනි කොටස: | ආයතනයේ පසුබිම | 7 |
| 3 වෙනි කොටස: | ශිෂ්‍යයින් බඳවාගැනීම | 9 |
| 4 වෙනි කොටස: | විදේශ සිසුන් බඳවා ගැනීම | 14 |
| 5 වෙනි කොටස: | පාඨමාලා සම්පූර්ණ කිරීම | 14 |
| 6 වෙනි කොටස: | අධ්‍යයන කාර්ය මණ්ඩලය | 15 |
| 7 වෙනි කොටස: | පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 16 |
| 8 වෙනි කොටස: | පර්යේෂණ ප්‍රකාශන සහ ඉදිරිපත්කිරීම් | 17 |
| 9 වෙනි කොටස: | පුහුණු සැසි සහ වැඩමුළු | 20 |
| 10 වෙනි කොටස: | ශිෂ්‍ය සමාජ හා ක්‍රියාකාරකම් | 24 |
| 11 වෙනි කොටස: | අධ්‍යයන වැඩ සටහන් සංවර්ධනය | 25 |
| 12 වෙනි කොටස: | විදේශීය / දේශීය සහයෝගිතා | 27 |
| 13 වෙනි කොටස: | සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය සහ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය | 30 |
| 14 වෙනි කොටස: | ධාරිතා සංවර්ධනය | 31 |
| 15 වෙනි කොටස: | සාමාන්‍ය පරිපාලනය | 33 |
| 16 වෙනි කොටස: | මූල්‍ය කාර්යසාධනය | 34 |
| 17 වෙනි කොටස: | විභවතා සහ අපේක්ෂා | 36 |
| ඇමුණුම 1: | 2019 වර්ෂය සඳහා විගණකාධිපතිගේ වාර්තාව | 39 |
| ඇමුණුම 2: | විගණකාධිපතිගේ වාර්තාව සඳහා ලබාදුන් පිළිතුර | 44 |
| ඇමුණුම 3: | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ගිණුම් ප්‍රකාශය | Note 1 |
| ඇමුණුම 4: | මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | Note 5 |

# සංවිධාන ව්‍යුහය


වි.වි.ප්‍ර.කො.ස
පාලක සභාව
සනාතන සභාව
අධ්‍යක්ෂ
කළමණාකරණ මණ්ඩලය
අභ්‍යන්තර සහ රජයේ විගණන අංශ
පරිපාලන කළමනාකරණ කාර්යාලය
අධ්‍යයන මණ්ඩලය
මූල්‍ය කළමනාකරණ කාර්යාලය
අධ්‍යයන වැඩසටහන් කළමනාකරණ කාර්යාලය

## කළමණාකරණ මණ්ඩලයේ සංයුතිය (2019 දෙසැම්බර් 31 දිනට)

| අනු අංකය | සාමාජිකයාගේ නම | සම්බන්ධතාවය | සාමාජිකත්වය |
|---|---|---|---|
| 01 | මහාචාර්ය ජේ.එම්. ආනන්ද ජයවික්‍රම | අධ්‍යක්ෂ/ මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | නිල බලයෙන් (සභාපති) |
| 02 | මහාචාර්ය ඕ.ජී. දයාරත්න බණ්ඩා | පීඨාධිපති/ ශාස්ත්‍ර පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 03 | මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු | පීඨාධිපති/ විද්‍යා පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 04 | මහාචාර්ය බී.කේ.එන්.ජී. පුෂ්පකුමාර | පීඨාධිපති/ කෘෂිකර්ම පීඨය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 05 | ඩබ්.කේ.එල්.ඊ. වලල්ලාවිට මහතා | උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යාංශය | නම් කරන ලද |
| 06 | ආර්.එම්. විජේසිංහ බණ්ඩා මහතා | මුදල් අමාත්‍යාංශය | නම් කරන ලද |
| 07 | අධ්‍යක්ෂ | මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා උසස් අධ්‍යයන ජාතික මධ්‍යස්ථානය | නිල බලයෙන් |
| 08 | අධ්‍යක්ෂ/පර්යේෂණ | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 09 | එම්.ඒ.එම්. යාසීර් මහතා | අංශ ප්‍රධානී/ අරාබි හා ඉස්ලාම් ශිෂ්ටාචාර අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 10 | මහාචාර්ය එම්.ඩබ්.සී.එන්.කේ. රඹුක්වැල්ල | අංශ ප්‍රධානී/ පුරාවිද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 11 | ආචාර්ය ආර්.පී.සෙනෙවිරත්න | අංශාධිපති/ ශාස්ත්‍රීය භාෂා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 12 | එච්.එම්.ඩබ්.එන්. හේරත් මහතා | අංශාධිපති/ ආර්ථික විද්‍යා හා සංඛ්‍යාන අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 13 | ආචාර්ය පී.ආර්.කේ.ඒ. විතාරණ | අංශාධිපති/ අධ්‍යාපන භාෂා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 14 | මහාචාර්ය සී. වික්‍රමගමගේ | අංශාධිපති/ ඉංග්‍රීසි අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 15 | ආචාර්ය එම්. අලවතුකොටුව | අංශාධිපති/ ලලිත කලා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 16 | එම්.ඒ.එස්. ජයකුමාර මහතා | අංශාධිපති/ භූගෝල විද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 17 | ආචාර්ය එන්.ඒ. විමලසේන | අංශාධිපති/ ඉතිහාස අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 18 | ආචාර්ය එස්.එස්.කේ.ඕ.එම්. දොරබාවිල | අංශාධිපති/ නීති පීඨය අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 19 | මහාචාර්ය ආර්.පී.ඩී. ජයවර්ධන | අංශාධිපති/ පාලි හා බෞද්ධ අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 20 | මහාචාර්ය පී.එම්. ජමාහිර් | අංශාධිපති/ දර්ශන විද්‍යා අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 21 | ආචාර්ය ඒ. විතානවසම් | අංශාධිපති/ දේශපාලන විද්‍යා අධ්‍යනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |

| | | | |
|---|---|---|---|
| 22 | ඩී.එම්.එම්.කේ. දිසානායක මහතා | අංශ ප්‍රධානී/ සිංහල අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 23 | ආචාර්ය ඩබ්.එම්.එස්.එම්.කේ. තෝරදෙණිය | අංශ ප්‍රධානී/ සමාජ විද්‍යා අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 24 | ආචාර්ය එස්.ආර්. තේවර් | අංශ ප්‍රධානී/ දෙමළ අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 25 | ආචාර්ය ජී.ආර්.කේ. දිසානායක | අංශ ප්‍රධානී/ මනෝවිද්‍යා අධ්‍යනාංශය පේරාදෙණිය විශ්වවිද්‍යාලය | නිල බලයෙන් |
| 26 | මහාචාර්ය ජී.ඩී.ආර්.යූ.යූ. අබේරත්න | සභාපති, සමාජ විද්‍යා අධ්‍යයන මණ්ඩලය | නිල බලයෙන් |
| 27 | මහාචාර්ය එච්.ඒ. ලියනගේ | සභාපති, භාෂා හා සාහිත්‍ය අධ්‍යක්ෂක මණ්ඩලය | නිල බලයෙන් |
| 28 | ආචාර්ය. එස්.ජේ.එස් ද මෙල් | සභාපති, ආර්ථික විද්‍යා හා කළමණාකරණ අධ්‍යයන මණ්ඩලය | නිල බලයෙන් |
| 29 | මහාචාර්ය පී. සේතුංග | සභාපති, මනෝවිද්‍යා, දර්ශන විද්‍යා හා අධ්‍යාපන අධ්‍යයන මණ්ඩලය | නිල බලයෙන් |
| 30 | මහාචාර්ය එම්. ඥාණානන්ද හිමි | සභාපති, ආගමික සහ සංස්කෘතික අධ්‍යයන අධ්‍යක්ෂ මණ්ඩලය | නිල බලයෙන් |
| 31 | මහාචාර්ය ජේ. උයන්ගොඩ | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද සාමාජික | පත් කරන ලද |
| 32 | ආචාර්ය ජේ.එම්.ගුණදාස | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජික | පත් කරන ලද |
| 33 | මහාචාර්ය ඩී.පී. ප්‍රේමසිරි | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජික | පත් කරන ලද |
| 34 | මහාචාර්ය කේ.ටී. සිල්වා | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද සාමාජික | පත් කරන ලද |

## 1 වන කොටස: 2019 වර්ෂය සඳහා ආයතනයේ අධ්‍යක්ෂකවරයාගේ ප්‍රකාශය/ සමාලෝචනය



මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයට අදාළව උසස් අධ්‍යාපනය සහ පුහුණු ලබාදීම මෙන්ම එම ක්ෂේත්‍රයේ පර්යේෂණ වැඩිදියුණු කිරීම සඳහා මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 24 වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ආඥාපනතක් මගින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2014 වසරේදී ස්ථාපිත කරන ලදී. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ අධ්‍යාපනය, පර්යේෂණ හා නිර්මාණශීලී චින්තනය පිළිබඳ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත් වෙමින් සමාජ මෙහෙවර පිළිබඳ සංවේදීතාවයකින් හෙබි විචාරශීලී හා නිදහස් චින්තනය තුළින් දැනුම ප්‍රගුණ කිරීමට කැපවූ විද්වතුන් බිහිකිරීම මෙම ආයතනයේ අරමුණ වේ.

වර්තමානයේදී මෙම ආයතනය ශාස්ත්‍රපති හා පශ්චාත් උපාධි පාඨමාලාද දර්ශනපති හා දර්ශනශූරී වැනි පර්යේෂණ උපාධි පාඨමාලාද පවත්වනු ලබයි. ඉහත පාඨමාලාවන්ට අරාබි, ගිණුම්කරණය, පුරාවිද්‍යාව, බෞද්ධ අධ්‍යයනය, ආර්ථික විද්‍යාව, අධ්‍යාපන, ශාරීරික අධ්‍යාපන, ඉංග්‍රීසි භාෂාව, ලලිත කලාව, භූගෝල විද්‍යාව, ග්‍රීක හා රෝම අධ්‍යයනය, හින්දු ශිෂ්ටාචාරය, ඉතිහාසය, ජාත්‍යන්තර සබඳතා, ඉස්ලාම් ශිෂ්ටාචාරය, නීතිය, කළමනාකරණය, පාලි භාෂාව, දර්ශනය, දේශපාලන විද්‍යාව, මනෝ විද්‍යාව, සංස්කෘත, සිංහල භාෂාව, සමාජ විද්‍යාව, සංඛ්‍යානය හා දෙමළ භාෂාව යන විෂය ක්ෂේත්‍ර ඇතුළත් වේ. වර්තමානය වනවිට මෙම ආයතනයට වාර්ෂිකව බඳවා ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව1200ක් පමණ වේ. බාහිර ඉගැන්වීම් හා අධීක්ෂණ කාර්ය මණ්ඩලය ලෙස සුදුසුකම්ලත් සම්පත්දායක පුද්ගලයෝ 180ක් පමණ කාර්යයන්හි නියැලෙති. මේ වනවිට පවත්වන අධ්‍යයන වැඩසටහන්වලට අමතරව විවිධ මට්ටමින් ඉල්ලුම පවතින අන්තර් විෂයික මෙන්ම බහු විෂයික ක්ෂේත්‍රයන්හි උපාධි වැඩසටහන් හඳුන්වාදීමේ ක්‍රියාවලියක මෙම ආයතනය නියැලී සිටී. ශ්‍රම බලකායේ හා කර්මාන්ත ක්ෂේත්‍රය තුළ පවතින සුවිශේෂී අවශ්‍යතාවන්ට සරිලන පරිදි කෙටි කාලීන පුහුණු වැඩසටහන් හඳුන්වාදීමට ද මෙම ආයතනය සැලසුම් කරයි. සාමාන්‍යයෙන් මෙම ආයතනයේ වාර්ෂිකව පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි අවසන් කරන ශිෂ්‍ය සංඛ්‍යාව 550කට අධිකය.

2019 වර්ෂය තුළ දී මෙම ආයතනය 2017 වසරේ අගභාගයේ දී ආරම්භ කළ එහි සාමාන්‍ය පරිපාලන ක්‍රියාකාරීත්වය විධිමත් කිරීම හා ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදුකරන ලදී. අතිරේක කාර්යමණ්ඩලය බඳවාගැනීම, රාජකාරී ලේඛනය සකස් කිරීම, කාර්ය මණ්ඩලයට වගකීම් පැවරීම, ඔවුන්ගේ කාර්යයන් අධීක්ෂණය හා පරීක්ෂා කිරීම වැනි කටයුතු සිදුකරමින් පරිපාලන සහ මූල්‍ය කාර්යාලවල කාර්යයන් සංවිධිත කරන ලදී. ආයතනය එහි ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය 2019 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාවට නංවන ලදී. කාර්යාල සහ පංති කාමර ආදියට අවශ්‍ය උපකරණ හා ලී බඩු මිලදී ගැනීම් බොහොමයක් 2019 වර්ෂයේ දී අවසන් කරන ලදී. ආයතනයේ සංයුක්ත සැලසුම පාදක කරගෙන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, අතුරු ව්‍යවස්ථා, පර්යේෂණ ප්‍රතිපත්ති හා රෙගුලාසි හා මාර්ගෝපදේශ සකස් කිරීම ද ධාරිතා සංවර්ධන සැලසුමට ඇතුළත් විය.

ආයතනයේ මූල්‍ය කාර්යය සාධනයද පූර්ව වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී වර්ධනය විය. 2019 වර්ෂයේ සමස්ත මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 131.923ක් විය. මෙහෙයුම් ආදායමින් 82% ක් පමණ ශිෂ්‍යයින් විසින් පාඨමාලා සඳහා ගෙවන ගාස්තුවලින් සමන්විත විය. මෙම වර්ෂයේ ආයතනයේ සමස්ත මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 82.930ක් විය. 2019 දී ආයතනයේ වාර්තාගත ශුද්ධ අතිරික්තය රුපියල් මිලියන 48.993ක් විය. එය 2018 වර්ෂයේදී වාර්තා වූ ශුද්ධ අතිරික්තය වන රුපියල් මිලියන 32.384ට වඩා රුපියල් මිලියන 16.6කින් සිදු වූ වර්ධනයකි.

මෙම ආයතනය අදාළ වසර තුළ සාමාන්‍ය කළමනාකරණයේ හා මුදල් හා ගිණුම් කළමනාකරණයේ සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කළේය. 2019 වර්ෂයේ දී එහි කාර්යසාධනය සහ මෙහෙයුම් කළමණාකරනය හේතු පාදක කොටගෙන ශ්‍රී ලංකා විගණකාධිපති විසින් මෙම ආයතනය තුළ මෙහෙයුම්, මුදල් හා ගිණුම් කළමනාකරණය සත්‍ය හා සාධාරණ යැයි සඳහන් කරන ලද අතර එය අප ආයතනය අත්කරගත් සුවිශේෂී ජයග්‍රහණයකි. ආයතනය විසින් අඛණ්ඩව වසර 3ක් තිස්සේ මෙම විශිෂ්ටතම විගණන පැසසුම් ලබාගනිමින් සිටී. ඒ කෙසේ වෙතත් මෙම ආයතනය වැඩිදුරටත් එහි මෙහෙයුම් ක්‍රියා පටිපාටිවල වෙනස්කම් සිදුකොට දුර්වල අංශ දියුණු කිරීමටත් අත්කරගත් තත්ත්වය තහවුරු කරගැනීමටත් කටයුතු කරයි.

2019 වර්ෂයේ දී මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි පර්යේෂණ ශක්‍යතාවය හා ප්‍රතිඵල දියුණු කිරීම හා ඉහළ නැංවීම සඳහා ක්‍රියාකාරකම් ආරම්භ කොට ඇත. ආයතනය එහි තුන්වන පර්යේෂණ සමුළුව 2019 මාර්තු 29 දින පැවැත් වූ අතර එහි දී ආයතනයේ විද්‍යාර්ථීන් විසින් බාරදුන් පර්යේෂණ පත්‍ර 50කට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත් කොට සාකච්ඡාවට භාජනය කරන ලදි. තවද ආයතනයේ සිසුන්ට විශාල පිටුවහලක් සපයන එහි පර්යේෂණ ජර්නලය වන මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ජර්නලය (JHS) පළකිරීමට ද කටයුතුකර ඇත. මෙම ආයතනයේ සිසුන්ට හා කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දැනුම හුවමාරු කරගැනීමට අවස්ථාව උදාකර දෙමින් 2019 වර්ෂයේ දී වැඩමුළු හා සම්මන්ත්‍රණ සංවිධානය කරන ලදි. 2019 වර්ෂයේ දී මෙම ආයතනය විදෙස් විශ්වවිද්‍යාල හා ආයතන සමඟ මෙන්ම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රජයේ සහ පෞද්ගලික නියෝජිතායතන සමඟත් සහයෝගීතා ආරම්භ කරන ලදි. විදෙස් ආයතන සමඟ සහයෝගීතා ඇතිකර ගැනීම තුළින් සිසුන් හා කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන්වලට හා ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවස්ථාව උදාකර දෙනු ලබයි.

ආයතනය එහි ප්‍රශස්ත විභවතාවට පැමිණීම සඳහා ඇතැම් අංශවල වැඩිදියුණු කිරීම් කළයුතුව තිබේ. එම අංශ දියුණු කිරීමට ආයතනය විසින් පියවර කිහිපයක් ගෙන තිබුණ ද සිසුන්ට අවශ්‍ය ඉගෙනුම්, පර්යේෂණ හා සුබසාධන පහසුකම් සැපයීම විශාල අභියෝගයක්ව පවතී. දෙස් විදෙස් සිසුන් වඩා වැඩි ප්‍රමාණයක් ආයතනයේ අධ්‍යයන වැඩසටහන් සඳහා ආකර්ෂණය කර ගැනීමට නවාතැන් පහසුකම් සැපයීමේ අවස්ථා හිඟවීම බාධාවක්ව පවතින අතර එය ආයතනයේ අනාගත සංවර්ධනයට ද බලපෑම් එල්ල කරයි. තවද විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ දී සිදුවන ප්‍රමාදය මගහරවා ගැනීම පිළිබඳව අවධානය යොමුකිරීම ද අවශ්‍යයෙන්ම කළ යුතුව පවතී. 2019 වර්ෂයේ දී විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට ගතවන කාලය අවමකිරීමට පියවරගනු ලැබීය. කෙසේවුවද තවදුරටත් මෙම ප්‍රමාදයන් අවමකරනු පිණිස අධීක්ෂණ ක්‍රියාවලිය බලගැන්විය යුතුය. ආයතනයේ සංයුක්ත සැලසුමෙන් හඳුනාගත් පරිදි නව උපාධි වැඩසටහන් සංවර්ධනය කිරීමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගිය ද එම වැඩසටහන් අනුමත කිරීමට ගතවන කාලය හේතුවෙන් එවැනි නව වැඩසටහන් ආරම්භ කිරීම ප්‍රමාද වේ.

ආයතනයේ ආරම්භයේ සිට අවුරුදු හතරක කාල පරිච්ඡේදය තුළ එහි පරිපාලන හා මුදල් කළමනාකරණය, වැඩසටහන් පැවැත්වීම, අධ්‍යයන හා පර්යේෂණ සංවර්ධනය, හැකියාවන් සංවර්ධය හා ආයතනයේ සමස්ත කාර්යසාධනය ඉතා සතුටුදායක හා ප්‍රශංසනීය බව මාගේ හැඟීමයි. මෙලෙස අත්කරගත් මෙම ප්‍රගතිය හා අත්දැකීම් සහ 2018 – 2022 සංයුක්ත සැලසුම මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම සඳහා මෙම ආයතනයට ඉඩප්‍රස්ථා උදාකරදෙනු ලබයි.

මහාචාර්ය ජේ.එම්. ජයවික්‍රම
අධ්‍යක්ෂ
මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

## 2 වන කොටස:  ආයතනයේ පසුබිම

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 24A වගන්තිය යටතේ සම්පාදිත, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ස්ථාපනය කරන ලද ජාතික ආයතනයකි. තාර්කික හා නිදහස් චින්තනය තුළින් දැනුම ප්‍රගමනය සඳහා කැපවුණු,ස්වකීය සමාජ වගකීම් පිළිබඳ මනා අවබෝධයකින් යුත් විද්වතුන් බිහිකිරීම උදෙසා මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ අධ්‍යාපන,පර්යේෂණ හා නිර්මාණශීලි පරිකල්පනයෙන් හෙබි විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම මෙම ආයතනයේ අරමුණයි.

වර්ෂ 2017දී ආයතනයේ පදනම සකස් කරමින් එහි ප්‍රථම පස් අවුරුදු සංයුක්ත සැලැස්ම පිළියෙල කරන ලදී. මෙම සංයුක්ත සැලැස්ම මඟින් ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර 3ක් යටතේ සපුරාගත යුතු ඉලක්ක 6ක් හඳුනාගෙන ඇත. එය පහත දැක්වෙන ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර ත්‍රිත්වය පිළිබඳ අවධානය යොමු කරයි. ඒවා නම් ඉගෙනුම් හා පර්යේෂණ කාර්යාවලියේ ගුණාත්මක බව හා ප්‍රමිතිය වැඩි දියුණු කිරීම, පරිපාලන හා මූල්‍ය කළමනාකරණයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම හා මනා පාලනය සහ ආචාරශීලි හැසිරීම ශක්තිමත් කිරීම වේ. 2018-2022 සඳහා වන සංයුක්ත සැලැස්ම මඟින් පහත දැක්වෙන ඉලක්ක 6 යටතේ අරමුණු දහඅටක් සහ උපාය මාර්ග හතළිස් හතරක් ඔස්සේ ක්‍රියාමාර්ග හැත්තෑඅටක් දියත් කිරීමට සැලසුම් කරයි.

- අධ්‍යයන වැඩසටහන්වලට ප්‍රවේශ වීම ඒවායේ ගුණාත්මක බව හා අදාළත්වය දියුණු කිරීම.
- අන්‍යෝන්‍ය වශයෙන් ගරු කිරීම, සමාජ සංවේදීතාවය, ගුණාත්මක ශිෂ්‍යත්ව සහ වෘත්තියත්වය යන කාරණා මත පදනම්වූ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.
- ක්‍රියාශීලි පර්යේෂණ සංස්කෘතියක් සහ දැනුම ව්‍යාප්ත කිරීම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් හඳුන්වා දීම.
- භෞතික යටිතල පහසුකම් සහ සේවා පහසුකම් සංවර්ධනය කිරීම.
- පරිපාලනයේ කාර්යක්ෂමතාවත් මූල්‍ය කළමනාකරණයේ තිරසාර බවත් ළඟා කර ගැනීම සහ
- ආයතනයේ සියළුම කටයුතුවල විනිවිදභාවය සහ යහපැවැත්ම තහවුරු කිරීම.

සංයුක්ත සැලැස්මේ සඳහන් කාර්යයන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම මඟින් ආයතනය මෙරටේ මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රයට අදාළව පශ්චාත් උපාධි අධ්‍යාපනයේ, පර්යේෂණ සහ නිර්මාණශීලි චින්තනයේ ප්‍රමුඛයා බවට හා කලාපයේ විශිෂ්ට ඉගෙනුම් මධ්‍යස්ථානය බවට පත්වීමට අපේක්ෂා කරයි.

ආයතනය විසින් වර්තමානයේ දී පහත සඳහන් උපාධි පාඨමාලා පවත්වනු ලැබේ.

පශ්චාත් උපාධි ඩිප්ලෝමා<br>
ශාස්ත්‍රපති පාඨමාලා<br>
දර්ශනපති පාඨමාලා<br>
දර්ශනශූරී පාඨමාලා

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් සපයනු ලබන ඉහත පාඨමාලාවන්ට පහත විෂයයන් ඇතුළත් වේ. අරාබි, ගණකාධිකරණය, පුරාවිද්‍යාව, බෞද්ධ අධ්‍යයන, ආර්ථික විද්‍යාව, අධ්‍යාපනවේදය, ඉංග්‍රීසි, ලලිත කලා, භූගෝල විද්‍යාව, ග්‍රීක හා රෝමානු අධ්‍යයන, හින්දු ශිෂ්ටාචාරය, ඉතිහාසය, ඉස්ලාම් ශිෂ්ටාචාරය, කළමනාකරණය, පාලි,

දර්ශනය, ශාරීරික අධ්‍යාපනය, දේශපාලනවිද්‍යාව, මනෝ විද්‍යාව, සංස්කෘත, සිංහල, සමාජ විද්‍යාව, සංඛ්‍යානය සහ දෙමළ

වර්ෂ 2019 වන විට ආයතනය විසින් පහත දැක්වෙන තේමාගත පශ්චාත් උපාධි පාඨමාලා සහ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා ප්‍රදානය කරනු ලබයි.

- ව්‍යවහාරික ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- අධ්‍යාපනපති උපාධිය
- සංවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ විද්‍යාපති උපාධිය
- තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ජාත්‍යන්තර සබඳතා පිළිබද ශාස්ත්‍රපති උපාධිය
- මානව හිමිකම් හා බහුසංස්කෘතිකවාදය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

තිරසාර සංචාරක කර්මාන්තය, ජාත්‍යන්තර සබඳතා සහ මානව හිමිකම් හා බහුසංස්කෘතිකවාදය පිළිබඳ වූ ශාස්ත්‍රපති පාඨමාලා 2019 වර්ෂයේදී හඳුන්වා දෙන ලදී. අදාළ ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සඳහා බැහැර වීමේ විකල්පයන් ලෙස සංවර්ධන ක්‍රියාමාර්ග, ජාත්‍යන්තර සබඳතා සහ මානව හිමිකම් සහ බහුසංස්කෘතිකවාදය පිළිබඳ වූ පශ්චාත් උපාධි පාඨමාලා ප්‍රදානය කරනු ලැබේ.

2019 වර්ෂයේ අගභාගයේදී ආයතනය විසින් පහත දැක්වෙන උපාධි පාඨමාලා සඳහා අනුමැතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබා ගන්නා ලදී.

- සමාජ කටයුතු පිළිබද ශාස්ත්‍රපති උපාධිය
- සමාජ කටයුතු පිළිබද පශ්චාත් උපාධි ඩිප්ලෝමාව(බැහැර වීමේ අවස්ථාව)
- ප්‍රජා සංවර්ධන හා සැලසුම්කරණය පිළිබද පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

ආයතනය විසින් ඉහත පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර 2020 වර්ෂයේදී එම පාඨමාලා ඇරඹීමට අපේක්ෂිතය. තවද ආයතනය විසින් 2019 වර්ෂය තුළදී පහත දැක්වෙන වෘත්තීය සහ කෙටිකාලීන පුහුණු පාඨමාලා දියණු කරන ලදී.

- බඳුකරණය පිළිබඳ විධායක ඩිප්ලෝමාව
- ව්‍යවහාරික භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ සහතිකපත් පාඨමාලාව
- අධ්‍යයන අරමුණු සඳහා ලේඛන හා සන්නිවේදන කුසලතා පිළිබඳ වූ සහතිකපත් පාඨමාලාව

2020 වර්ෂයේදී මෙම පාඨමාලා ආරම්භ කිරීමට ආයතනය සැලසුම් කරයි.

අන්තර්විෂයික හා බහුවිෂයික ක්ෂේත්‍ර පිළිබඳ අවධානය යොමු කරමින් දැනට පවතින පාඨමාලාවන්ට හා අලුතෙන් හඳුන්වා දෙන පාඨමාලා ප්‍රවේශයට වැඩි ඉඩ ප්‍රස්තාවක් ලබාදෙමින් ස්වකීය පශ්චාත් උපාධි පාඨමාලාවන් තව දුරටත් පුළුල් කිරීමට හා අවශ්‍ය සංශෝධන සිදු කිරීමට ආයතනය සිය සැලසුම් අඛණ්ඩව යොදාගනු ලබයි. සංයුක්ත සැලැස්මේ හඳුනාගෙන ඇති පරිදි සහ අවශ්‍යතා පැනනගින පරිදි නව පාඨමාලා සංවර්ධනය කිරීමේ කටයුතුවල ආයතනය අඛණ්ඩව නියැලී සිටී. එමෙන්ම පෞද්ගලික සහ රාජ්‍ය අංශයේ ආයතනවල සහභාගීත්වය ද ඇතිව ශ්‍රම බලකාය උදෙසා කෙටි කාලීන පාඨමාලා පැවැත්වීමේ කාර්යයෙහිද ආයතනය නියැලී සිටී.

## 3 වන කොටස ශිෂ්‍යයින් බඳවා ගැනීම

2019 දෙසැම්බර් 31 වන විට පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා සඳහා ආයතනයෙහි ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 1 සිට 5 දක්වා වගු වලින් ලබා දෙයි. 2019 වර්ෂය තුළදී පශ්චාත් උපාධි පාඨමාලා සහ උපාධි පාඨමාලා සඳහා මෙම ආයතනය ශිෂ්‍යයින් 1238ක් ඇතුළත් කරගෙන තිබේ. 2018 වර්ෂය සමඟ සසඳන විට ආයතනය මඟින් 2019 වර්ෂයේදී ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීම 162කින් වැඩි වී ඇත. තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ විද්‍යාපති උපාධිය, තිරසාර සංචාරක කර්මාන්තය පිලිබඳ ශාස්ත්‍රපති උපාධිය, ජාත්‍යයන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, මානව සම්පත් හා බහු සංස්කෘතිකවාදය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය වැනි නව උපාධි අවස්ථා ලබා දීමත් ව්‍යවහරික ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි ව්‍යුහයේ කරන ලද සංශෝධනක්, අධ්‍යාපනය පිළිබඳ දර්ශනපති උපාධිය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමත් යන සාධක 2019 වර්ෂය සඳහා සිසුන් වැඩි සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට ප්‍රධාන වශයෙන් දායක වී ඇත. කෙසේ වෙතත් අධ්‍යාපනය හැර සෙසු සියලු විෂය ක්ෂේත්‍ර වලින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම 2019 වර්ෂයේදී සැලකිය යුතු ලෙස පහත වැටී ඇත. මෙම පහත වැටීමට හේතු වන්නේ ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයට (SLQF) අනුව, අදාළ සංශෝධිත සුදුසුකම් සපුරාලීමේ නිර්ණායක හරහා අදාළ විෂය ක්ෂේත්‍ර සඳහා පන්ති සාමාර්ථයක් අහිමි ප්‍රථම උපාධිධරයන්ටද ශාස්ත්‍රපති උපාධි සඳහා ලියාපදිංචි වීමට සෘජුවම ඉඩ සලසා තිබීමයි.

1 වෙනි වගුව
පාඨමාලා අනුව ශිෂ්‍යයින් බඳවා ගැනීම, 2017 -2019 (දෙසැම්බර් 31 දිනට)

| පාඨමාලාව | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| පශ්චාත් උපාධි පාඨමාලා | 214* | 592 | 583 |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලා | 260** | 403 | 440 |
| දර්ශනපති උපාධි පාඨමාලා | 71 | 69 | 197 |
| දර්ශනශූරී උපාධි පාඨමාලා | 21 | 12 | 18 |
| එකතුව | **566** | **1076** | **1238** |


සැ.යු.* අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (සති අන්ත) නොපවත්වන ලදී.** අධ්‍යාපනපති උපාධි පාඨමාලාව නොපවත්වන ලදී.
මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

මෙම ආයතනයේ උපාධි පාඨමාලාවන්ට ශාස්ත්‍රපති උපාධියට අදාළ විෂය ක්ෂේත්‍ර 21 ක් ඇතුළුව අධ්‍යාපනපති, සංවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ ශාස්ත්‍රපති, ව්‍යවහරික ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති, තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ විද්‍යාපති, ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති සහ මානව සම්පත් හා බහුසංස්කෘතිකවාදය පිළිබඳ ශාස්ත්‍රපති යන උපාධි පාඨමාලා අන්තර්ගත වේ. ශාස්ත්‍රපති උපාධි පාඨමාලා වලට 2018 වර්ෂය සඳහා ඇතුළු කර ගන්නා ලද සිසුන් සංඛ්‍යාව 403ක් ලෙස දැක්වේ. 2018 වර්ෂය සමඟ සසඳන විට 2019 වර්ෂයේ දී ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම 37කින් පමණ වැඩි වී ඇත. දර්ශනපති උපාධි පාඨමාලාව සඳහා 2018 වර්ෂයේදී ආයතනය විසින් සිසුන් 69 ක් ඇතුළත් කරගෙන ඇත. 2019 වර්ෂයේදී මෙම සංඛ්‍යාව 197 දක්වා වැඩි වී ඇත. අධ්‍යාපනය පිළිබඳ දර්ශනපති උපාධි පාඨමාලාව 2019 වර්ෂයේ දී යළි ආරම්භයත්, එලෙසම අනෙකුත් පාඨමාලා සඳහා වඩා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීමත් මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වේ. දර්ශනශූරී උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ වර්ධනය වාර්තා වී ඇත්තේ 2018 වර්ෂය සඳහා සිසුන් 12 සිට 2019 වර්ෂය සඳහා සිසුන් 18 ක් ලෙසිනි. දර්ශනශූරී උපාධි වැඩසටහන් සඳහා වඩා වැඩි අවධානයක් යොමු කරමින් ප්‍රචාරණය වැඩිකිරීම, ශිෂ්‍යත්ව ලබාදීම, පහසුකම් සැලසීම

සහ දිරිගැන්වීම් තුළින් වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට ආයතනය සැලසුම් කරයි.

1 ප්‍රස්තාරය

වැඩසටහන් අනුව සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රතිශත ව්‍යාප්තිය, 2018 සහ 2019




මූලාශ්‍රය: 1 වගුවට අනුව.

අධ්‍යයන පාඨමාලා සඳහා ශිෂ්‍යයින් ඇතුළත් කර ගැනීමේ ප්‍රතිශත ව්‍යාප්තිය 1 රූපසටහන මඟින් පෙන්වයි.2018 හා 2019 වර්ෂ අතර, පාඨමාලා සඳහා ශිෂ්‍යයින්ගේ ප්‍රතිශත ව්‍යාප්තිය සැලකිය යුතු වෙනසක් පෙන්වයි. පශ්චාත් උපාධි පාඨමාලාවන්ට 2018 වර්ෂය සඳහා 55% ක් වූ ශිෂ්‍ය ප්‍රතිශතය ව්‍යාප්තිය 2019 වසර වන විට 47% දක්වා පහත වැටී ඇත. ශාස්ත්‍රපති උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍ය ප්‍රතිශත ව්‍යාප්තියද, 2018 වසරේදී 38% වූ අතර, 2019 වර්ෂයේදී එය 36% ක් ලෙස පහත වැටී ඇත. කෙසේ වෙතත් දර්ශනපති උපාධිය සඳහා ශිෂ්‍ය දායකත්වය 2018 දී 6% ක් වූ අතර, 2019 වන විට 16% දක්වා සැලකිය යුතු ලෙස වැඩි වී ඇත. පෙර සාකච්ඡා කරන ලද පරිදි මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ අධ්‍යාපනය පිළිබඳ දර්ශනපති උපාධි පාඨමාලාව සහ අනෙකුත් විෂය ක්ෂේත්‍ර සඳහා වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමයි. තවද දර්ශනශූරි උපාධි පාඨමාලා හැදෑරූ සිසුන්ගේ ප්‍රතිශත දායකත්වය ද සුළු වශයෙන් වැඩි විය. මෙම ප්‍රතිශත වැඩි වීම මඟින් විදහා දක්වන්නේ පර්යේෂණ උපාධි පාඨමාලා වලට ආයතනය මඟින් මෑතකදී වඩා වැඩි අවකාශයක් වෙන් කිරීමට අවධානය යොමු කිරීමයි.

2 වෙනි වගුව මඟින් නිරූපණය කරන්නේ ස්ත්‍රී පුරුෂ භාවය අනුව 2017, 2018, 2019 වර්ෂ සඳහා ඇතුළත් කරගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාවයි. 2018 වර්ෂයේදී සම්පූර්ණ ඇතුළත් කරගැනීම් වලින් 30% ක් පමණ ශිෂ්‍යයින් වූ අතර 70%ක් ශිෂ්‍යාවන් විය. ඇතුළත් කරගන්නා ලද සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් ශිෂ්‍යාවන් සංඛ්‍යාව තව දුරටත් වැඩිවෙමින් 2019 අධ්‍යයන වර්ෂය සඳහා පිළිවෙලින් 29% හා 71% ලෙස මෙම අනුපාත වෙනස් වී ඇත. ස්ත්‍රී පුරුෂ භාවය අනුව පාඨමාලා මඟින් සිසුන් ඇතුළත් කර ගැනීම පහත පරිදි වේ. 2019 වර්ෂයේදී ස්ත්‍රී පාර්ශවයෙන් වැඩිමනත් විද්‍යාර්ථීන් සංඛ්‍යාවක් බඳවා ගැනීම හේතුවෙන් සියලුම පර්යේෂණ උපාධි පාඨමාලා සඳහා ස්ත්‍රී දායකත්වය බෙහෙවින් වැඩි වී ඇත. එයට හේතු වන්නේ ආයතනය විසින් අධ්‍යාපනික වැඩසටහන් සඳහා වැඩිමනත් ශිෂ්‍යාවන් සංඛ්‍යාවක් බඳවා ගැනීමයි.

2 වගුව

සිසුන් ඇතුළත් කර ගැනීම


පාඨමාලා සහ ස්ත්‍රී / පුරුෂ භාවය අනුව, 2017 – 2019 (දෙසැම්බර් 31 දිනට)

| පාඨමාලාව | 2017 | | 2018 | | 2019 | |
|---|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා | 76 | 138 | 141 | 463 | 83 | 500 |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලා | 95 | 165 | 135 | 256 | 170 | 270 |
| දර්ශනපති උපාධි පාඨමාලා | 44 | 27 | 39 | 30 | 92 | 105 |
| දර්ශනශූරී උපාධි පාඨමාලා | 11 | 10 | 10 | 2 | 10 | 8 |
| එකතුව | **226** | **340** | **325** | **751** | **355** | **883** |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

2 ප්‍රස්තාරය

සිසුන් බඳවා ගැනීම (පාඨමාලා සහ ස්ත්‍රී / පුරුෂ භාවය අනුව)




මූලාශ්‍රය: 2 වගුවට අනුව.

සමාජ විද්‍යා අධ්‍යයන මණ්ඩලය මගින් පහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලාවන් ප්‍රදානය කරයි.

- පුරා විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- භූගෝල විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- ඉතිහාසය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- දේශපාලන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (බැහැර වීමේ අවස්ථාව)
- මානව හිමිකම් හා බහු සංස්කෘතිකවාදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (බැහැර වීමේ අවස්ථාව)
- පුරා විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති ශාස්ත්‍රපති උපාධිය
- භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- මානව හිමිකම් හා බහු සංස්කෘතිකවාදය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

- දර්ශනපති උපාධිය සහ
- දර්ශනශූරී උපාධිය (ඉහත විෂය ක්ෂේත්‍ර හෝ අන්තර් විෂය ක්ෂේත්‍ර වලට අදාළ උපාධි පාඨමාලා)

භාෂා හා සාහිත්‍ය අධ්‍යයන මණ්ඩලය මඟින් පහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලාවන් ප්‍රදානය කරයි.

- සිංහල විෂය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- දෙමළ විෂය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- ඉංග්‍රීසි විෂය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

- දර්ශනපති උපාධිය සහ
- දර්ශනශූරී උපාධිය (ඉහත විෂය ක්ෂේත්‍ර හෝ අන්තර් විෂය ක්ෂේත්‍ර වලට අදාළ උපාධි පාඨමාලාවන්)

ආර්ථික විද්‍යා හා කළමනාකරණ මණ්ඩලය මඟින් පහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලොමා සහ උපාධි පාඨමාලාවන් ප්‍රදානය කරයි:

- ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- ගිණුම්කරණය හා මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (බැහැර වීමේ අවස්ථාව)

- ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ව්‍යවහරික ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- සංවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ විද්‍යාපති උපාධිය

- දර්ශනපති උපාධිය සහ
- දර්ශනශූරී උපාධිය (ඉහත විෂය ක්ෂේත්‍ර හෝ අන්තර් විෂය ක්ෂේත්‍ර වලට අදාළ උපාධි පාඨමාලාවන්)

මනෝ විද්‍යාව,දර්ශනය හා අධ්‍යාපනවේද මණ්ඩලය මඟින් වර්තමානයේ පහත දැක්වෙන උපාධි ප්‍රදානය කරයි.

- මනෝ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- දර්ශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- අධ්‍යාපනවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
- ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

- දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- අධ්‍යාපනපති උපාධි

- දර්ශනපති උපාධිය සහ
- දර්ශනශූරී උපාධිය (ඉහත විෂය ක්ෂේත්‍ර හෝ අන්තර් විෂය ක්ෂේත්‍ර වලට අදාළ උපාධි පාඨමාලාවන්)

ශිෂ්‍යයින් ඇතුළු කර ගන්නා ප්‍රමුඛතම පාඨමාලා ලෙස අධ්‍යාපනවේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ අධ්‍යාපනපති උපාධි පාඨමාලාව දැක්විය හැක. අධ්‍යාපනවේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව ආකාර දෙකකට පවත්වනු ලබයි. ඒ සතියේ දින පාඨමාලා හා සති අන්ත පාඨමාලා වශයෙනි. සතියේ දින වල පාඨමාලා පැවැත්වෙන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් තෝරා ගන්නා ලද සිසුන් සඳහාය. එබැවින් සිසුන් ඇතුළත් කර ගන්නා කාල සීමා ආයතනයේ පාලනයෙන් තොරය.

ආගමික හා සංස්කෘතික අධ්‍යයන මණ්ඩලය මගින් දැනට පහත පාඨමාලා හඳුන්වා දී ඇත:

- ○ බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව
- ○ පාලි පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව
- ○ සංස්කෘත පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව
- ○ ග්‍රීක හා රෝමානු අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව
- ○ හින්දු ශිෂ්ටාචාරය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව
- ○ ඉස්ලාම් ශිෂ්ටාචාරය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව
- ○ ලලිත කලා පශ්චාත් උපාධි පාඨමාලාව

- ○ බෞද්ධ අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ○ පාලි විෂය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ○ සංස්කෘත විෂය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ○ ග්‍රීක හා රෝමානු අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ○ හින්දු ශිෂ්ටාචාරය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ○ ඉස්ලාම් ශිෂ්ටාචාරය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ○ ලලිතකලා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

- ○ දර්ශනපති උපාධිය සහ
- ○ දර්ශනශූරී උපාධිය (ඉහත විෂය ක්ෂේත්‍ර හෝ අන්තර් විෂය ක්ෂේත්‍ර වලට අදාළ උපාධි පාඨමාලාවන්)

3 වෙනි වගුව ආයතනයේ අධ්‍යයන මණ්ඩල පහ මගින් ආයතනය සඳහා ශිෂ්‍යයින් ඇතුළු කර ගන්නා අයුරු පෙන්වයි. ගණනය කිරීම් වලට අනුව දර්ශනය, මනෝ විද්‍යාව හා අධ්‍යාපනවේදී මණ්ඩල මගින් මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා සිදු කළ සමස්ත බඳවා ගැනීම් වලින් 62%ක් සිදුකර ඇත. අධ්‍යයන මණ්ඩලය යටතේ මෙලෙස විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් ඇතුළත් කර ගැනීමට දායකත්වය ලබාදෙන්නේ අධ්‍යාපනවේදය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා, අධ්‍යාපනපති හා අධයාපනවේදය පිළිබඳ දර්ශනපති උපාධි පාඨමාලා සඳහා විශාල වශයෙන් ශිෂ්‍යයින් බඳවා ගැනීමයි. තවද පසුගිය වසර දෙක තුල ආර්ථික විද්‍යාව හා කළමනාකරණ මණ්ඩලය මගින් බඳවා ගන්නා ලද ශිෂ්‍ය සංඛ්‍යාවේ කැපී පෙනෙන වර්ධනයක් ඇත.

3 වෙනි වගුව
ශිෂ්‍යයින් බඳවා ගැනීම (අධ්‍යයන මණ්ඩල අනුව) 2017 – 2019 (දෙසැම්බර් 31 දිනට)

| අධ්‍යයන මණ්ඩලය | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| සමාජ විද්‍යාව | 200 | 166 | 151 |
| භාෂා හා සාහිත්‍ය අධ්‍යන | 57 | 67 | 41 |
| ආර්ථික විද්‍යාව හා කළමනාකරණය | 78 | 131 | 187 |
| මනෝ විද්‍යාව , දර්ශනය සහ අධ්‍යාපනවේදය | 120 | 621 | 763 |
| ආගමික හා සංස්කෘතික අධ්‍යයන | 111 | 91 | 96 |
| එකතුව | 566 | 1076 | 1238 |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මා.ශා.හා ස.වි.ප.උ.ආයතනය

## 4 වෙනි කොටස විදේශ සිසුන් බඳවා ගැනීම

4 වගුව මඟින් පශ්චාත් උපාධි ඩිප්ලෝමා හා උපාධි පාඨමාලා සඳහා මෙම ආයතනයේ ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව පෙන්වයි. වර්ෂ 2018 දී ආයතනය විසින් විදේශ සිසුන් 23 දෙනෙකු ඇතුළත් කරගන්නා ලදී. මෙම සිසුන් 29 දෙනා පාඨමාලා අතර බෙදීගොස් ඇත්තේ ශාස්ත්‍රපති උපාධිය සඳහා 22ක් හා දර්ශනපති උපාධිය සඳහා 7ක් වශයෙනි. 2018 හා 2019 යන වර්ෂ තුළ දර්ශනශූරි උපාධි පාඨමාලා සඳහා සෘජුවම ඇතුළත් කර ගන්නා ලද සිසුන් නොවීය. විදේශ සිසුන්ගෙන් බහුතරයක් පාලි හා බෞද්ධ අධ්‍යයන සම්බන්ධ පශ්චාත් උපාධි පාඨමාලා හා පර්යේෂණ සඳහා වැඩි අවධානයක් දක්වති.

4 වගුව
විදේශ සිසුන් බඳවා ගැනීම (පාඨමාලා අනුව) 2017 – 2019 (දෙසැම්බර් 31 දිනට)

| පාඨමාලාව | 2017 | 2018 | 2019 |
|---|---|---|---|
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 8 | 3 | 0 |
| ශාස්ත්‍රපති උපාධි පාඨමාලා | 4 | 19 | 22 |
| දර්ශනපති උපාධි | 8 | 1 | 7 |
| දර්ශනශූරි උපාධි | 5 | 0 | 0 |
| එකතුව | **25** | **23** | **29** |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය ,මා.ශා.හා ස.වි.ප.උ.ආයතනය

## 5 වෙනි කොටස පාඨමාලා නිම කිරීම

5 වෙනි වගුව මඟින් 2017, 2018 හා 2019 යන වර්ෂ වලදී මෙම ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලා නිම කළ සිසුන් සංඛ්‍යාව පිළිබඳ දත්ත සපයයි. මෙම ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලා නිම කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව 2017 වර්ෂය සඳහා 516ක් වූ අතර, 2017 වර්ෂය වන විට 568 දක්වා වර්ධනය වී ඇත. කෙසේ වෙතත් 2019 දී මෙම සංඛ්‍යාව 501ක් ලෙස දැක්වේ. 2019 වසරේදී සිසුන් 158ක් පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ද සිසුන් 331ක් ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ද සිසුන් 8ක් දර්ශනපති උපාධි පාඨමාලාව ද සිසුන් 4ක් දර්ශනශූරි උපාධි පාඨමාලාව ද නිම කරන ලදී.

5 වෙනි වගුව
පාඨමාලා නිම කරන ලද ශිෂ්‍ය සංඛ්‍යා 2017 – 2019 (දෙසැම්බර් 31 දිනට)

| පාඨමාලාව | 2017 | | 2018 | | 2019 | |
|---|---|---|---|---|---|---|
| | සං. | % | සං. | % | සං. | % |
| පශ්චාත් උපාධි පාඨමාලා | 230 | 44.57 | 242 | 42.60 | 158 | 31.54 |
| ශාස්ත්‍රපති උපාධි/අධ්‍යාපනපති උපාධි/සංවර්ධන ශාස්ත්‍රපති | 267 | 51.74 | 307 | 54.04 | 331 | 66.06 |
| දර්ශනපති උපාධි | 13 | 2.52 | 13 | 2.28 | 8 | 1.60 |
| දර්ශනශූරි උපාධි | 6 | 1.16 | 6 | 1.08 | 4 | 0.80 |
| එකතුව | **516** | **100.00** | **568** | **100.00** | **501** | **100.00** |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය, මා.ශා.හා ස.වි.ප.උ.ආයතනය

අතීතයේ ප්‍රතිඵල නිකුත්කිරීම සඳහා දිගුකාලීනව වූ ප්‍රමාද වීම්, පාඨමාලා නිම කිරීමට ගතවන කාලය සඳහා මෙන් ම සිසුන්ගේ වෘත්තීය ප්‍රගතිය සඳහාත් අහිතකර ලෙස බලපායි. අධීක්ෂකයින්ට පැහැදිලි මෙහෙයුම් නිර්ණායක හා උපදෙස් ලබා දීම මගින් 2018 වසරේ සිට ප්‍රතිඵල නිකුත් කිරීමට ගතවන කාලය අඩු කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. කෙසේ වුවත් ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී වන ප්‍රමාදවීම් අවම කිරීම සඳහා අධීක්ෂණ ක්‍රියාවලිය බලගැන්විය යුතුය.

## 6 වෙනි කොටස අධ්‍යයන කාර්යය මණ්ඩලය


මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් 2019 වර්ෂයේ දී උපාධි පාඨමාලා ලබා දීම සඳහා බාහිර පදනම යටතේ 147 දෙනෙකුගෙන් යුත් අධ්‍යයන කාර්යය මණ්ඩලයක සේවය ලබා ගන්නා ලදී. 6 වන වගුවේ දැක්වෙන පරිදි පශ්චාත් උපාධි මට්ටමේ සුදුසුකම් සහිත මහාචාර්යවරු 27ක්, සහාය මහාචාර්යවරු 6ක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු (1 හා 11 ශ්‍රේණියේ ) 104 ක් සහ කථිකාචාර්යවරු 10 ක් මීට ඇතුලත් වේ. බාහිර කාර්ය මණ්ඩලය, පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය හා අනෙකුත් පීඨ, ශ්‍රී ලංකාවේ සහ විදෙස් රටවල අනෙකුත් විශ්වවිද්‍යාල, පර්යේෂණ සහ උසස් අධ්‍යාපන ආයතන සහ විශ්‍රාමික ශාස්ත්‍රඥයින්ගෙන් යුක්ත වේ. ඉගැන්වීමේ හා නිබන්ධන අධීක්ෂණයේ යෙදෙන මහාචාර්යවරු සංඛ්‍යාව අධ්‍යයන කටයුතු වල නිරත වන සමස්ත කාර්ය මණ්ඩලයෙන් 22% ක් පමණ වේ. තවද ගණනය කිරීම් අනුව සමස්ත බාහිර කාර්ය මණ්ඩලයෙන් 70% ක් පමණ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු වේ. ඉතිරි සංඛ්‍යාව විශේෂයෙන් ම දර්ශනපති උපාධි හෝ ඊට ඉහළ පශ්චාත් උපාධි සහිත විද්වතුන් වේ. සමස්ත බාහිර කාර්ය මණ්ඩලයෙන් 70% ක් පුරුෂ පාර්ශවයෙන් වන අතර 30% ක් ස්ත්‍රී පාර්ශවයෙන් වේ.

6 වෙනි වගුව
ආයතනයේ බාහිර කාර්ය මණ්ඩලය (2019 දෙසැම්බර් 31 දිනට)

| විෂය | මහාචාර්යවරු | | සහාය මහාචාර්යවරු | | ජ්‍යෝ.කථිකාචාර්යවරු | | කථිකාචාර්යවරු | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පු | ස් | පු | ස් | පු | ස් | පු | ස් | පු | ස් |
| ආයතනයේ අධ්‍යයන හා පශ්චාත් උපාධි පාඨමාලා අධීක්ෂණයේ යෙදෙන කාර්ය මණ්ඩලය | 22 | 5 | 5 | 1 | 69 | 35 | 7 | 3 | 103 | 44 |

මූලාශ්‍රය: ලේඛකාධිකාරී කාර්යාලය මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

3 රූප සටහන
බාහිර කාර්ය මණ්ඩලයේ ප්‍රතිශත ව්‍යාප්තිය - 2018




මූලාශ්‍රය : 6 වගුව මත පදනම්ව.

2019 වර්ෂයේදී මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් එම ආයතනයේ සම්පත් සංචිතය සඳහා අයදුම්පත් කැඳවන ලදී. අධ්‍යයන හා අධීක්ෂණ කාර්ය මණ්ඩලය හා එක්වන ලෙස සුදුසුකම් සපුරා ඇති සම්පත් දායකයින්ගෙන් අයදුම්පත් කැඳවීය. අයදුම්පත් 246ක් යොමුකර තිබූ අතර සම්පත් සංචිතය සඳහා අවශ්‍ය පරිදි බඳවා ගැනීම් සිදු කිරීමට ඒවා අධ්‍යයන මණ්ඩලයේ සභාපති වෙත යොමු කරන ලදී. දර්ශනය, මනෝ විද්‍යාව හා අධ්‍යාපනවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය මගින් විභව්‍ය සම්පත් දායකයින් 50දෙනෙකු තෝරාගෙන ඇති අතර ඔවුන්ට දින දෙකක පුහුණුවක් ලබා දී තිබේ.

## 7 වන කොටස පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය

මානවශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය තුළ අනුමත කාර්යය මණ්ඩල තනතුරු 13 ක් පවතින අතර ඊට අධ්‍යක්ෂ, සහකාර ලේඛකාධිකාරි, සහකාර මූල්‍යාධිකාරි, ලඝු ලේඛක, ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික නිලධාරි, තාක්ෂණික නිලධාරි, කළමනාකරණ සහකාර තනතුරු 4ක්, සරප්, රියදුරු සහ කම්කරු යන තනතුරු ඇතුළත්ය. 2019 වසර වන විට සියලුම අනුමත මූලික සේවක අවශ්‍යතා සපුරන ලදි. ආයතනයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ මත අතිරේක තනතුරු 12 ක අවශ්‍යතාව හඳුනාගෙන ඇත. එම යෝජනාව මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

**7 වගුව**

**2019 දෙසැම්බර් 31 දිනට බඳවා ගන්නා ලද පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

| කාර්ය මණ්ඩලයේ ස්වභාවය | කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|
| | පරිපාලන කාර්ය මණ්ඩලය | අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය | තාක්ෂණික කාර්ය මණ්ඩලය | ලිපිකරු හා සමාන්කර ශ්‍රේණි | ප්‍රාථමික කාර්ය මණ්ඩලය | එකතුව |
| අනුමත කාර්ය මණ්ඩලය | 3 | | 2 | 6 | 2 | 13 |
| පවත්නා කාර්ය මණ්ඩලය | | | | | | |
| ස්ථිර කාර්ය මණ්ඩලය | 3 | | 2 | 6 | 2 | 13 |
| කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය | | | | 7 | 2 | 09 |

මූලාශ්‍රය: රෙජිස්ට්‍රාර් කාර්යාලය , මා.ශා.හා ස.වි.ප.උ.ආයතනය

ස්ථිර කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම නිසා ආයතනය මගින් උත්පාදිත අරමුදල් යොදාගෙන කොන්ත්‍රාත් පදනම යටතේ සේවකයන් 9 දෙනෙකුගේ සේවය ලබා ගන්නා ලදී. එහි අරමුණ වූයේ රාජකාරි හා වගකීම් ආවරණය කිරීමත් ස්ථිර සේවකයින්ගේ අතිරේක රාජකාරි අවම කිරීමත්ය. මෙම තනතුරු වලට වැඩසටහන් නිලධාරි, NORAPART ව්‍යාපෘතියේ ලේකම්, තාක්ෂණික නිලධාරී හා කම්කරු යන තනතුරු ඇතුළත් විය. තවද සංවර්ධන ශාස්ත්‍රපති, අධ්‍යාපනවේදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ අධ්‍යාපනපති වැනි විශේෂ අවශ්‍යතා ඇති පාඨමාලා සඳහා එම පාඨමාලාවල පිරිවැය යටතේ වැඩසටහන් සහායකයින් කුලී පදනම මත ලබාගෙන ඇත.

## 8 වන කොටස: පර්යේෂණ ප්‍රකාශ සහ ඉදිරිපත්කිරීම

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ආයතනයේ එක් වැදගත් අරමුණක් වන්නේ සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ දැනුම ව්‍යාප්ත කිරීමය. වර්තමානය වන විට ආයතනය දර්ශනශූරී, දර්ශනපති හා ශාස්ත්‍රපති පාඨමාලා කාර්යයන් හරහා පර්යේෂණ පාඨමාලා වල නියැලී සිටී. වර්ෂ 2019 දී විද්‍යාර්ථීන් 12 දෙනෙක් ඔවුන්ගේ නිබන්ධන නිම කර ඉදිරිපත් කොට තිබුණි. මෙම සම්පූර්ණ කරන ලද නිබන්ධන වලට දර්ශනශූරී නිබන්ධන 04 ක් හා දර්ශනපති නිබන්ධන 08 ක් ඇතුළත් විය. 9 වෙනි වගුව මගින් දැක්වෙන්නේ නිම කරන ලද නිබන්ධන වල තොරතුරුය.

8 වෙනි වගුව
පර්යේෂණ ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම , 2019

| විෂය | සම්පූර්ණ කළ/ප්‍රකාශයට පත් කළ | ඉදිරිපත් කළ |
|---|---|---|
| නිබන්ධන | 12 | 12 |
| ලිපි | 10 | --- |
| පර්යේෂණ (නිබන්ධන වලින් උපුටාගත් පත්‍රිකා) | 52 | 52 |
| වෙනත් | --- | --- |
| එකතුව | 74 | 64 |

මූලාශ්‍රය: රෙජිස්ට්‍රාර් කාර්යාලය , මා.ශා.හා ස.වි.ප.උ.ආයතනය

9 වෙනි වගුව
2019 වර්ෂයේ සම්පූර්ණ කරන ලද නිබන්ධන වල තොරතුරු

| අනු අංකය | ශිෂ්‍යයාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | උපාධිය | අධ්‍යයන මණ්ඩලය |
|---|---|---|---|---|
| 1 | පූජ්‍ය කේ. විජය භිමි | A Study of the Teaching of Theravada Buddhism among the Ethnic Nationalities in the Present Union of Myanmar. | දර්ශනශූරී | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 2 | කේ.ජී.වී.ඩී. ධර්මසිරි | The Poetical Works of Repiyel Tennakoon: An Investigative Study | දර්ශනශූරී | භාෂා හා සාහිත්‍ය අධ්‍යයන |
| 3 | කේ.ඒ. වෙලිංටන් පියකුමා | Friendship, a means to Happiness: A Study of the Concepts of Suhadamitta and Kalyanamitta in the Sutta Pitaka and the Areas of Convergence between Aristotelian-Thomistic and Buddhist Concepts of Friendship | දර්ශනශූරී | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 4 | අයිෂාත් ෂාහිනා | Gender Differentials in Enrollment, Retention and Completion of Higher Education in the Maldives | දර්ශනශූරී | සමාජීය විද්‍යා |
| 5 | එච්.ඒ.එස්.පී. හෙට්ටිආරච්චි | A Semiotic Reading of Perfume Advertisement in Sri Lankan Visual and Print Media | දර්ශනපති | දර්ශනය, මනෝවිද්‍යාව හා අධ්‍යාපන |

| | | | | |
|---|---|---|---|---|
| 6 | ආර්.එම්.ඊ.එස්. මානැව | A Narrative Folklorastic Study of selected Geographical Locations in the Sathkorale | දර්ශනපති | භාෂා හා සාහිත්‍ය අධ්‍යයන |
| 7 | එන්.ජී.ඊ.යූ. නුගලියැද්ද | The Use of Sinhala in Modern Media Technology | දර්ශනපති | භාෂා හා සාහිත්‍ය අධ්‍යයන |
| 8 | පූජ්‍ය ප්‍රියෝ රන්ජන් ටොන්වන්ග්‍ය හිමි | The Concept of Mind in the *Suttapitaka*: An Analysis from Buddhist Phenomenological Perspective | දර්ශනපති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 9 | එච්.එම්.යූ.ටී. කේ. හේරත් | Ethnomusicological Analysis of Songs Composed to Promote the Image of Former Sri Lanka President Mahinda Rajapaksa | දර්ශනපති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 10 | පූජ්‍ය එම්. විමලජෝති හිමි | A Structural and Comparative study of the Theravada Bhikkhu and Bhikkhuni Vinaya Codes: with special reference to Parajika, Sanghadisesa and Aniyata | දර්ශනපති | ආගමික හා සංස්කෘතික අධ්‍යයන |
| 11 | පූජ්‍ය පී.විමලසාර හිමි | The Influence of Pali Sanskrit Ritis on Sinhalese Prose Style (an Investigative study with special reference to selected books) | දර්ශනපති | භාෂා හා සාහිත්‍ය අධ්‍යයන |
| 12 | සී. කෝපිනාත් | Water related Conflicts between Communities: with the special reference to Iranamadu water supply project | දර්ශනපති | සමාජීය විද්‍යා |


දැනුම නවෝත්පාදන ප්‍රචලිත කිරීම සහ දැනුම ව්‍යාප්ත වීම ප්‍රමාණවත් නොවන තත්ත්වයක පවතින විට එම දැනුම සමාජය මත ඇතිකරන බලපෑම අල්ප බව පැහැදිලි කරුණකි. සාකච්ඡා, සැසි, සම්මන්ත්‍රණ පැවැත්වීම තුළින් දැනුම ව්‍යාප්ත කිරීමට සහ හුවමාරු කර ගැනීමටත් පර්යේෂණ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීමට පහසුකම් සැලසීමටත් අවශ්‍ය මූලික පියවර ආයතනය විසින් ගනු ලැබේ. 2019 වර්ෂයේදී ආයතනය එහි තෙවන පර්යේෂණ සමුළුව පැවැත්වීය. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික පර්යේෂණ සමුළුව මහාචාර්ය උපාලි බී. දිසානායක උපකුලපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2019 මාර්තු මස 29 වන දින පැවැත්වීය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ **(UNDP)** ශ්‍රී ලංකා නියෝජ්‍ය නේවාසික නියෝජිතවරිය වන ඇන්ඩ්‍රියා කියු**z**(සි)යෝවා මහත්මිය විසින් සමුළුවේ ප්‍රධාන දේශනය පවත්වන ලදී. සමුළුවේදී සිය පර්යේෂණ ඉදිරිපත් කළ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත්



උපාධි ආයතනයේ පශ්චාත් උපාධි විද්‍යාර්ථීන් මෙම සමුළුවේ විශිෂ්ටතම ප්‍රතිලාභීන් විය. මෙම උපුටනයන් සමුළු ප්‍රකාශනයේ පල කරන ලදී. පශ්චාත් උපාධි සිසුන්, විදේශීය විද්වතුන්, පර්යේෂකයින් හා බාහිර අධ්‍යයන කාර්ය මණ්ඩලය ඇතුළු 250 කට අධික පිරිසක් මෙම සමුළුවට සහභාගි වූහ. ආයතනය එහි ශිෂ්‍යයින්ගේ සහ පොදුවේ අනෙකුත් සාමාජිකයින්ගේ පර්යේෂණ හා කාර්ය ධාරිතා වැඩි දියුණු කිරීම උදෙසා වාර්ෂික පර්යේෂණ සමුළු, පරිසංවාද, දළ විශ්ලේෂණ සැසි, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම අඛණ්ඩව සිදු කරයි.

තවද ආයතනය සිය ප්‍රථම ශාස්ත්‍රීය ජර්නලය 2017 වර්ෂයේදී ආරම්භ කලේය. මෙම ද්විවාර්ෂික පර්යේෂණ ජර්නලයේ/ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ජර්නලයේ (JHS) ප්‍රධාන අරමුණ වන්නේ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍යයින්ට සහ අනෙකුත් පර්යේෂකවරුන්ට තම පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තා පල කිරීමට අවස්ථාව සලසා දීමයි. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ සමුළුවේ දී පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන පර්යේෂකයින්ට ද තම පර්යේෂණ පත්‍රිකා මෙම ජර්නලයේ පල කිරීමට හැකියාව තිබේ. 2018 වර්ෂයේදී මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ජර්නලයේ කාණ්ඩ 02 ක් ආයතනය විසින් පල කරන ලදී. සමස්ත පර්යේෂණ පත්‍රිකා 10 ක් හා පොත් පිළිබඳ වූ විචාර 02 ක් ජර්නලයේ I වන වෙළුමේ I හා II කාණ්ඩයන්හි පල කරන ලදී. පර්යේෂණ පත්‍රිකා පහක් සහ පොත් පිළිබඳ වූ විචාර දෙකක් ඇතුළත්ව මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ජර්නලයේ (JHS) 2 වන වෙළුමේ I කාණ්ඩය 2019 වර්ෂයේ අග භාගයේ දී පල කරන ලදී. පර්යේෂණ ලිපි 6 ක් හා පොතක් පිළිබඳ වූ විචාරයක් සහිතව 2 වන වෙළුමේ II කාණ්ඩය මේ වන විට නිමකොට මුද්‍රණය සඳහා ලබා දී ඇත. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ජර්නලයේ ප්‍රකාශිත පත්‍රිකා හා උක්ත විචාරයන් උසස් මට්ටමේ පවතින අතර විශේෂයෙන් ම අදාළ ක්ෂේත්‍රයන්හී යොවුන් පර්යේෂකයින්ට ඉතා ප්‍රයෝජනවත් වේ.

ඵලදායී සහ ඉහළ මට්ටමකින් යුත් පර්යේෂණ පවත්වා ගෙන යාමටත් ඒවා පල කිරීමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසමින් පශ්චාත් උපාධි සිසුන් විසින් ආරම්භ කරන ලද පර්යේෂණ කටයුතු දිරිමත් කිරීමට සහ ඒ සඳහා සහාය ලබා දීම පිණිස වැඩි වැඩියෙන් සම්පත් සහ පහසුකම් සලසා දීම කෙරෙහි ආයතනය සිය අවධානය යොමු කරයි. දේශීය සහ/ හෝ විදේශීය පුද්ගලයින්, කණ්ඩායම් සහ කීර්තිමත් සංවිධාන සමඟ උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ සම්බන්ධයෙන් ඵලදායී සම්බන්ධතා ගොඩ නඟා ගනිමින් පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් හි ආයතනය දැනට නියැලී සිටින ප්‍රමාණය තවදුරටත් පුළුල් කිරීමට එම ප්‍රයත්නය මඟින් අපේක්ෂා කරයි. උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය තවදුරටත් ඉහළ නැංවීම පිණිස අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ නියෝජිත ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය සහ අනෙකුත් උසස් අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතන වැනි දේශීය ආයතන සමඟ සබඳතා සහ සහයෝගීතා ස්ථාපිත කිරීමද සිදු කරනු ලබයි.



## 9 වෙනි කොටස පුහුණු සැසි හා වැඩමුළු

විෂය මාලා සංවර්ධන / සංශෝධන වැඩමුළු

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2019 වර්ෂයේදී එහි පවතින පශ්චාත් උපාධි පාඨමාලා වල සංශෝධන ආරම්භ කරන ලදී.

i. සාමාන්‍ය උපාධි පාඨමාලාවන්ට ශාස්ත්‍රපති, දර්ශනපති, දර්ශනශූරී පාඨමාලා හඳුන්වා දීම සහ
ii. පාඨමාලා ව්‍යුහයේ සහ විෂය ක්ෂේත්‍ර අනුව උපාධි පාඨමාලා වල විෂය නිර්දේශයන්හි සිදු කරන ලද සංශෝධන.

අධ්‍යක්ෂ කාර්යාලය හා මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන මණ්ඩල වල සභාපතිවරුන් විසින් සාමාන්‍ය පාඨමාලාවන්හි විෂය මාලා සම්බන්ධීකරණය සිදු කරනු ලබයි. හඳුන්වා දීමට නියමිතව තිබූ සියලුම සාමාන්‍ය පාඨමාලාවන්හි විෂය නිර්දේශ වල ප්‍රථම කෙටුම්පත සංවර්ධනය කර සාකච්ඡාව සඳහා අධ්‍යයන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. විෂය ක්ෂේත්‍ර අනුව විෂය නිර්දේශ සංශෝධන වැඩසටහන් අධ්‍යයන මණ්ඩල වල සභාපතිවරුන් විසින් හා පශ්චාත් උපාධි සම්බන්ධීකාරකවරුන් විසින් අධ්‍යක්ෂගේ මෙහෙයුම් නිර්ණායක ඔස්සේ සිදු කරනු ලැබේ. පශ්චාත් උපාධි පාඨමාලා සම්බන්ධීකාරකවරුන් විසින් මෙම වර්ෂය සඳහා සංශෝධන ක්‍රියාවලිය ආරම්භ කොට විෂය මාලා සංවර්ධන වැඩමුළු කිහිපයක් පවත්වන ලදී. 2019 වර්ෂයේදී පවත්වන ලද විෂය මාලා සංවර්ධන වැඩමුළු පිළිබඳ විස්තර 10 වෙනි වගුව මඟින් නිරූපණය කරයි. ඒ අනුව 2019 වර්ෂයේදී පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන්හී වැඩමුළු පවත්වන ලදී. දර්ශනය, පාලි හා බෞද්ධ අධ්‍යයනය, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව, සමාජ විද්‍යාව, භූගෝලය සහ ඉතිහාසය යන විෂය ක්ෂේත්‍ර පිළිබඳ වැඩමුළු සාර්ථකව පවත්වනු ලැබීය. ඉතිහාස විෂය පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාවේ සංශෝධිත විෂය නිර්දේශයන්හි ප්‍රථම කෙටුම් පත මේ වන විට සකසා ඇත.


10 වෙනි වගුව
2019 වර්ෂයේ දී පවත්වන ලද විෂය මාලා සංවර්ධන වැඩමුළු

| වැඩසටහන / මාතෘකාව | දිනය / දින |
|---|---|
| දර්ශනය පිළිබඳ පශ්චාත් උපාධි විෂය මාලා සංවර්ධන වැඩමුළුව | 2019 පෙබරවාරි 28 දින |
| පාලි හා බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි විෂය මාලා සංවර්ධන වැඩමුළුව | 2019 ජූනි 24දින |
| දේශපාලන විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි විෂය මාලා සංවර්ධන වැඩමුළුව | 2019 ජූලි 07 දින |
| ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි විෂය මාලා සංවර්ධන වැඩමුළුව | 2019 අගෝස්තු 22 දින |
| සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි විෂය මාලා සංවර්ධන වැඩමුළුව | 2019 සැප්තැම්බර් 20 දින |
| භූගෝල විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි විෂය මාලා සංවර්ධන වැඩමුළුව | 2019 අගෝස්තු 20 දින හා 2019 ඔක්තොම්බර් 25 වෙනි දින |
| ඉතිහාසය පිළිබඳ පශ්චාත් උපාධි විෂය මාලා සංවර්ධන වැඩමුළුව | 2019 දෙසැම්බර් 03 දින |

**මානව අයිතිවාසිකම් හා බහුසංස්කෘතිකවාදය පාඨමාලාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන**

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මානව අයිතිවාසිකම් හා බහුසංස්කෘතිකවාදය පාඨමාලාව (MHRMC) පිළිබඳ දළ විශ්ලේෂණයක් හා දැනුවත් කිරීමේ වැඩසටහනක් ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී 2019 පෙබරවාරි 6 වැනි දින පවත්වන ලදී. මෙම හමුවේ ප්‍රධාන අරමුණ වූයේ නව ශාස්ත්‍රපති පාඨමාලා පිළිබඳ අවබෝධයක් ඇති කිරීමයි. තවද පාඨමාලා සම්බන්ධයෙන් කටයුතු කරන බලධාරීන් සහ ආයතන ප්‍රධානීන් හමුවීමට විභව්‍ය අයදුම්කරුවන්ට මෙමඟින් අවස්ථාව ලැබුණි. මෙහිදී මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා විසින් උපාධි පාඨමාලා වල සමාලෝචනයක් සිදු කරන ලදී. මානව අයිතිවාසිකම් සම්බන්ධයෙන් කටයුතු කරන රජය, පෞද්ගලික අංශ හා රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරමින් පුද්ගලයින් 60 දෙනෙක් මෙම අවස්ථාවට සහභාගී වූහ.






**කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මඟින් සම්පත් සංචිතයේ සාමාජිකයින්ගේ ධාරිතා වර්ධනය සඳහා පවත්වනු ලැබූ කෙටි කාලීන පුහුණු වැඩසටහන.**


කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය (MoWCA) විසින් කාන්තා හා ළමා රැකවරණය සහ සංවර්ධනය පිළිබඳ විශේෂඥයින්ගෙන් යුත් සම්පත් සංචිතයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබීය. න්‍යායාත්මක, පරිකල්පනාමය, ක්‍රමවේදී, ප්‍රායෝගික දැනුමෙන් හා ශිල්පීය ඥානයකින් හෙබි සම්පත් දායකයින් ශක්තිමත් කිරීමෙන් ළමා සුරැකුම් හා සංවර්ධන කටයුතු සාර්ථකව ක්‍රියාවට නැංවිය හැකි බව අමාත්‍යාංශය හඳුනාගනු ලබයි. මෙම කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් තේමාගත මාතෘකා 12ක් ආවරණය වන පරිදි මොඩියුල සැකසීම උදෙසාත් ඒ සඳහා තෝරාගන්නා ලද සම්පත් දායකයින් 60 දෙනෙකුගෙන් යුත් සම්පත් සංචිතයක් / මඩුල්ලක් පුහුණු කිරීම සඳහාත් අමාත්‍යාංශය විසින් තෝරා ගන්නා ලද්දේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයයි.

සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් මොඩියුල පහක් සකස් කරන ලද අතර පුහුණු පාඨමාලා ආරම්භ වීමට දින 10 කට පෙර එම මොඩියුල වල ඉංග්‍රීසි අනුවාදය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. අමාත්‍යාංශය විසින් යෝජිත සංශෝධන අන්තර්ගත කිරීමෙන් අනතුරුව මොඩියුල පහේ සිංහල හා දෙමළ අනුවාද සකස් කරන ලදී. ආයතනය විසින් එම මොඩියුල පහ සම්පූර්ණ කිරීමෙන් අනතුරුව දස දින නේවාසික පුහුණු පාඨමාලාවක් මහනුවර දී පවත්වන ලදී. කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ 60 දෙනෙකුගෙන් සමන්විත නිලධාරීන් පිරිසක් (සිංහල මාධ්‍යය 48 ක් හා දෙමළ මාධ්‍යය 12 ක්) පුහුණු වැඩමුළුව සඳහා සහභාගී වූහ. මෙම පුහුණු වැඩමුළුව 2019 මාර්තු 26 සිට අප්‍රේල් 5 දක්වා කාලය තුළ පවත්වනු ලැබීය.

මෙම පුහුණුකරුවන් පුහුණු කිරීමේ දස දින වැඩසටහන සාර්ථකව නිම කරන ලද අතර පෙර හා පසු පුහුණු අවස්ථා සංසන්දනය කිරීමේදී සතුටුදායක සාධන මට්ටමක් නිරීක්ෂණය කරන ලදී. වැඩසටහනට සහභාගී වූ අමාත්‍යාංශ නිලධාරීන්, තේමාගත විෂය පථ 06ක් ඔස්සේ පුහුණු වැඩසටහනේ නියැලී සිටින බිම් මට්ටමේ නිලධාරීන් හා පුද්ගලයින් පුහුණු කිරීමට කුසලතා පූරණය කර ඇත.

උක්ත පුහුණු වැඩසටහන් වලදී නිර්දේශ කරනු ලබන්නේ පුහුණු නිලධාරීන් විසින් සිය අභිමත විෂය පථ කෙරෙහි වඩා වැඩි අවධානයක් යොමු කිරීමයි. කෙසේ වුවත් පුහුණු නිලධාරීන් විසින් අදාළ පුහුණු ක්ෂේත්‍රයන්හී අඛන්ඩ වර්ධනය උදෙසා නව ප්‍රමිති, නීති රීති ආදිය පිළිබඳව දැනුවත් වීමටත් නවතම සංවර්ධන ප්‍රවණතා පිළිබඳ හඳුනා ගැනීමටත් කාලය කැප කළ යුතුය. තවද පුහුණු වැඩසටහනේ නියැලී සිටින සම්පත්දායකයින් හා විශේෂඥයින් විසින් අනාවරණය කර ගත් ගැටළු හා ප්‍රශ්න පිළිබඳ පැහැදිලි කිරීමක් හා ඊට අදාළ මාර්ගෝපදේශ ලබා ගැනීම ද පුහුණු නිලධාරීන්ගෙන් අපේක්ෂා කෙරේ.






**මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද පුහුණු සැසි**

ආයතනය විසින් එහි වෘත්තිකයන්ගේ ධාරිතාව, දැනුම සහ කුසලතා වර්ධනය උදෙසා පුහුණු සැසි හා වැඩමුළු කිහිපයක් 2019 වර්ෂයේදී සැලසුම් කරන ලදී. මින් ප්‍රථම වැඩමුළුව වෘත්තීය අචාර ධර්ම හා කොන්දේසි සහ රාජකාරි ඉටු කිරීම යන තේමාව යටතේ 2019 ජූලි 02 වෙනි දින ආයතනයේ රැස්වීම් ශාලාවේදී පවත්වන ලදී. මෙම වැඩමුළුව මෙහෙයවන ලද්දේ පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ හිටපු උප කුලපති ආචාර්ය ජේ.එම්. ගුණදාස මහතා සහ කළමනාකරණ අධ්‍යයන මණ්ඩලයේ විද්වතෙකු විසිනි. ආයතනයේ සියලුම ස්ථිර කාර්ය මණ්ඩලය හා තාවකාලික/ කොන්ත්‍රාත් පදනම මත රාජකාරි කරන කාර්ය මණ්ඩලය ද මෙම වැඩමුළුවට සහභාගී වූහ. තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සහ ආයතනය විසින් එම ඉලක්ක සපුරා ගැනීමට දායක වූ ආකාරය පිළිබඳ වූ වැඩමුළුවක් 2019 ඔක්තොම්බර් 30 වෙනි දින පවත්වන ලදී. ආචාර්ය ජේ.එම්. ගුණදාස මහතා සම්පත් දායකයා වූ අතර ආයතනයේ කාර්යාල කාර්ය මණ්ඩලය සහ ආයතනයේ අභ්‍යන්තර විගණන ඒකකය මෙම වැඩමුළුවට සහභාගී වූහ. එමෙන්ම කාර්යාල කාර්ය මණ්ඩලයේ වෘත්තීය කුසලතා සංවර්ධනය සම්බන්ධයෙන් වූ බැහැරගත පුහුණුවක් හා වැඩමුළුවක් 2019 දෙසැම්බර් 30 වෙනි දින පවත්වන ලදී.





මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආරාධිත දේශන මාලාව (GLS)

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පර්යේෂණ දැනුම ව්‍යාප්තිය උදෙසා සිය දායකත්වය වැඩි කිරීමට මෙන් ම එහි ශිෂ්‍යයින්ට හා කාර්ය මණ්ඩලයට ක්ෂේත්‍රයේ විශේෂඥයින් සමඟ ශාස්ත්‍රීය සාකච්ඡා පැවැත්වීමට අවස්ථාව ලබා දෙනු වස් 2017 වර්ෂයේදී ආරාධිත දේශන මාලාවක් සංවිධානය කර තිබුණි. දෙස් විදෙස් විද්වතුන්ට/ පර්යේෂකයින්ට මෙම ආයතනය තුළ ආරාධිත දේශන පැවැත්වීම සඳහා ආරාධනා කරනු ලබයි. ආරාධිත දේශන මාලා සම්බන්ධීකරණය සිදු කරනු ලබන්නේ ආචාර්ය ආර්. රමේෂ් මහතා විසිනි. 2019 වසරේ දී ආරාධිත විද්වතුන් විසින් පවත්වනු ලැබූ දේශන මාලා ත්‍රිත්වයක් ආයතනය විසින් පවත්වන ලදී. පවත්වන ලද දේශන ත්‍රිත්වය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මාතෘකාව | දේශකයා | දිනය |
|---|---|---|
| Human Dignity - A Dynamic Concept | සහාය මහාචාර්ය ඇඩිනේ වැලන් - සෙන්ස්ටැඩ් | 2019 පෙබරවාරි 07 වෙනි දින |
| Mannar Mass Murder; Victims, Perpetrators and Motives | මහාචාර්ය පි.වී.ජේ. ජයසේකර/ එම්. ශ්‍රියානී ගුණරත්න | 2019 මාර්තු 21 වෙනි දින |
| The Role of Teacher in the 21st Century (පශ්චාත් උපාධි ඩිප්ලෝමා අධ්‍යාපන වැඩසටහනේ සමාරම්භක දේශනය සමඟ) | එච් . එම් . චන්ද්‍රසේකර (විවෘත විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ හිටපු උප කුලපති) | 2019 දෙසැම්බර් 16 වෙනි දින |

පශ්චාත් උපාධි සිසුන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය හා මහජනතාව ඇතුළත්ව 500 කට අධික පිරිසක් මෙම ආරාධිත දේශන මාලා වලට සහභාගි වූහ. කෙසේ වුව ද 2019 වසර තුළ සිදුවුණු නොවැලැක්විය හැකි හේතු කරණකොට ගෙන එම වසර තුළ පැවැත්වීමට හැකි වූයේ පැවැත්වීමට අපේක්ෂිත දේශන මාලාවන්ට වඩා අඩු ප්‍රමාණයකි.






## 10 වෙනි කොටස ශිෂ්‍ය සමාජ හා ක්‍රියාකාරකම්

මානවශාස්ත්‍ර සහ සමාජ විද්‍යා උපාධි ආයතනයේ කළමණාකරන මණ්ඩලය කාණ්ඩ 3ක් යටතේ ශිෂ්‍ය සමාජ ස්ථාපිත කිරීමට තීරණය කරන ලදී. ඒවා නම් ශිෂ්‍ය වැඩසටහන් සමාජය, අධ්‍යයන මණ්ඩල ශිෂ්‍ය සමාජය සහ පොදු ශිෂ්‍ය සමාජයයි. ආයතනයේ පශ්චාත් උපාධි ශිෂයින්ට මෙම මට්ටම් තුනේම ශිෂ්‍ය සමාජ සඳහා සමාජිකත්වය ලබා ගැනීමට අවස්ථාව තිබේ. මේ අතරින් පොදු ශිෂ්‍ය සමාජය සාමූහික සංවිධානය වන අතර වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්මට අනුව වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම පිළිබඳ වගකීම මෙම පොදු ශිෂ්‍ය සමාජය සතුය. ශිෂ්‍ය සමාජයේ ප්‍රධානතම වගකීම වනුයේ සාමාජික ශිෂ්‍යයින්ගේ රුචිකත්වයන්, පොදු යහපත, අයිතීන් සහ අවශ්‍යතා පිළිබඳ කටයුතු කිරීම, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සහ පැවැත්වීම සහ ශිෂ්‍යයින් සහ කාර්ය මණ්ඩලය අතර අන්තර් ක්‍රියාකාරකම් සහ සමගිය පවත්වා ගෙන යාම සඳහා පහසුකම් සැලසීමයි. ශිෂ්‍යයින් සඳහා ඉගෙනුම් සහ පර්යේෂණ අවස්ථා පුළුල් කිරීම සහ අනෙකුත් පාඨමාලා සංවර්ධනය කිරීම සඳහා දායකත්වය ලබා දීම වේ.


පොදු ශිෂ්‍ය සමාජය විසින් 2019 වසරේ අප්‍රේල් මාසයේ දී සිංහල දෙමළ අලුත් අවුරුදු උත්සවයක් ආයතන පරිශ්‍රයේ දී පැවැත්විණි. ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය එච්.එස්.පී.පී. කරුණාරත්න මහතා සහභාගී විය. ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය ආනන්ද ජයවික්‍රම සහ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති මහාචාර්ය ඕ. ජී. දයාරත්න බණ්ඩා යන මහත්වරු ද මෙම අවස්ථාවට සහභාගී වූහ. ආයතනයේ අධ්‍යන හා කාර්යාල කාර්ය මණ්ඩලය සහ පශ්චාත් උපාධි සිසුන් 200 කට අධික සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් මෙම වැඩ සටහන පවත්වන ලදී. එහිදී ශිෂ්‍යයින් සහ අධ්‍යන කාර්ය මණ්ඩලය විසින් සාම්ප්‍රදායික සිංහල අවුරුදු චාරිත්‍ර චාරිත්‍ර හා ජන ක්‍රීඩා වල නියැලුණි.







පොදු ශිෂ්‍ය සමාජය විසින් ශිෂ්‍ය පර්යේෂණ ඉදිරිපත් කිරීමේ වැඩසටහනක් හා සාකච්ඡා සැසියක් 2019 ඔක්තොම්බර් මාසයේදී සංවිධානය කරන ලදී. මෙම වැඩසටහනේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ශිෂ්‍යයින්ගේ අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් වලට අවකාශ සැලසීමත්, ඔවුන්ගේ පර්යේෂණ කාර්ය හා සොයා ගැනීම් පිළිබඳ සාකච්ඡා කිරීමට ඉඩ ලබා දීමත්ය. මෙම අවස්ථාවට ආරාධිත අධ්‍යයන කාර්ය මණ්ඩලයට හා අධීක්ෂකයින්ට ද ආරාධනා කරනු ලබන අතර ශිෂ්‍ය කාර්යයන් පිළිබඳ මාර්ගෝපදේශකයන් ලෙස කටයුතු කිරීම අපේක්ෂා කරනු ලැබේ.



## 11 වෙනි කොටස අධ්‍යයන වැඩ සටහන් සංවර්ධනය

විශේෂයෙන් ජාතික අවශ්‍යතා සහ රටේ උවමනාවන් පිළිබඳ අවධානය යොමු කරමින් තම අධ්‍යයන සහ පර්යේෂණ පදනම ශක්තිමත් කිරීම සඳහා මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දැඩි ලෙස ප්‍රයත්න දරා ඇති අතර ඒ සඳහා ක්‍රියාකාරිව කටයුතු කරමින් සිටී. මෙම සුවිශේෂී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා 2018 වර්ෂයේ සිට ආයතනය විසින් නව වෙළඳපල අරඹයා වන තේමාගත උපාධි පාඨමාලා හඳුන්වා දීමේ වැඩසටහන ආරම්භ කොට ඇත. 2019 වර්ෂයේ දී ආයතනය විසින් පහත දැක්වෙන නව උපාධි පාඨමාලා ආරම්භ කරන ලදී.

- තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ විද්‍යාපති උපාධිය
- ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිතව බැහැර වීමේ අවස්ථාව)
- මානව අයිතිවාසිකම් හා බහු සංස්කෘතිකවාදය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිතව බැහැර වීමේ අවස්ථාව.)

2019 වර්ෂයේදී පහත සඳහන් නව උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී තිබුණි.

- සමාජ කටයුතු පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සහ ප්‍රජා සංවර්ධන හා සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිතව බැහැර වීමේ අවස්ථාව)

ආයතනය විසින් 2018 සහ 2019 වර්ෂයන්හි දී පහත සඳහන් නව ශාස්ත්‍රපති සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී.

| අනු අංකය | උපාධි හෝ ඩිප්ලෝමා වැඩසටහන | SLQF මට්ටම | වි.ප්‍ර.කො. මඟින් අනුමැතිය ලබා ගත් දිනය |
|---|---|---|---|
| 1 | ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති | 9 | 2018 ඔක්තොම්බර් 04 වෙනි දින |
| 2 | ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (බැහැර වීමේ අවස්ථාව) | 8 | 2018 ඔක්තොම්බර් 04 වෙනි දින |
| 3 | තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ විද්‍යාපති උපාධිය | 10 | 2018 ඔක්තොම්බර් 18 වෙනි දින |
| 4 | තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 9 | 2018 ඔක්තොම්බර් 18 වෙනි දින |
| 5 | මානව අයිතිවාසිකම් හා බහු සංස්කෘතිකවාදය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 9 | 2019 අගෝස්තු 08 වෙනි දින |
| 6 | මානව අයිතිවාසිකම් හා බහු සංස්කෘතික වාදය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (බැහැර වීමේ අවස්ථාව) | 8 | 2019 අගෝස්තු 08 වෙනි දින |
| 7 | සමාජ කටයුතු පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 9 | 2019 අගෝස්තු 08 වෙනි දින |
| 8 | සමාජ කටයුතු පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (බැහැර වීමේ අවස්ථාව) | 8 | 2019 අගෝස්තු 08 වෙනි දින |
| 9 | ප්‍රජා සංවර්ධන හා සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 8 | 2019 අගෝස්තු 08 වෙනි දින |

තවද ආයතනය විසින් 2019 වර්ෂයේ දී පහත දැක්වෙන නව උපාධි පාඨමාලා වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇත.

- පරිසර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිතව බැහැර වීමේ අවස්ථාව)
- භූ දර්ශන පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිතව බැහැර වීමේ අවස්ථාව )
- බැංකුකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය
- ප්‍රජා ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය
- ප්‍රජා ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (බැහැර වීමේ අවස්ථාව)
- අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සහ
- මුල් ළමාවිය රැකවරණය හා සංවර්ධනය පිළිබඳ විද්‍යාපති උපාධිය (පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිතව බැහැර වීමේ අවස්ථාව)

මෙම උපාධි පාඨමාලා වැඩසටහන් වල යෝජනා අනුමැතියට ඉදිරිපත් කොට ඇත.

තවද ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ දී පහත සඳහන් උපාධි පාඨමාලා වැඩි දියුණු කිරීමට පියවර ගෙන ඇත.

- නාගරික හා ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ විද්‍යාපති උපාධිය
- නාගරික හා ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ස්ත්‍රී පුරුෂ සමාජභාව අධ්‍යයනය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමා
- ස්ත්‍රී පුරුෂ සමාජභාව අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය
- ජපන් භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා

අග්නිදිග නෝර්වීජියානු විශ්ව විද්‍යාලය (USN) සහ NORPART ව්‍යාපෘතිය


වර්ෂ 2018 දී NORPART ව්‍යාපෘතිය යටතේ නෝර්වීජියානු විශ්වවිද්‍යාලය (USN) හා එක්ව මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් මානව හිමිකම් හා බහුසංස්කෘතිකවාදය සම්බන්ධ පශ්චාත් උපාධි පාඨමාලාව, ඊට අදාල පර්යේෂණ හා අධ්‍යයන සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. 2019 වර්ෂයේදී පේරාදෙනිය විශ්වවිද්‍යාලය හා අග්නිදිග නෝර්වීජියානු විශ්වවිද්‍යාලය අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමෙන් අනතුරුව මෙම ශිෂ්‍ය කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන හා අධ්‍යයන සහයෝගීතාව අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

2019 වසරේදී සැලසුම් කළ පරිදි ශිෂ්‍ය හුවමාරු කටයුතු ක්‍රියාත්මක විය. 2019 වර්ෂයේ වසන්ත සමාසිකයේදී කාර්ය මණ්ඩල සාමාජිකයෝ 04 දෙනෙක් ECTS 7.5ක් (සම්මාන 15ක්) හා ගිම්හාන සමාසිකයේදී ශිෂ්‍යයෝ තිදෙනෙක් ECTS 15ක් (සම්මාන 30ක්) ලබා ගනිමින් එක් අධ්‍යයන වාරයක් අග්නිදිග නෝර්වීජියානු විශ්වවිද්‍යාලයේ දී සාර්ථකව නිම කළහ. ඒකාබද්ධ පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති යටතේ අග්නිදිග නෝර්වීජියානු විශ්වවිද්‍යාලයේ සාමාජිකයෝ සිවු දෙනෙක් 2019 පෙබරවාරි මාසයේ දී මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පැමිණියහ.

මාතෘකා 03 ක් යටතේ පර්යේෂණ ව්‍යාපෘති 03 ක් දියත් කරන ලදී.
1. මානව හිමිකම්, සමාජ සාධාරණය සහ සාමය සඳහා අධ්‍යාපනය.
2. සංස්කෘතිය හැඩගැස්වීම: දේශීය සංස්කෘතිය මත ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නියෝජිතායතන මඟින් ඇති කරන බලපෑම.
3. අවදානම් සාධක, සහායක පද්ධති, සහ සම්පත් වලට ප්‍රවේශ වීම.

2019 වර්ෂය තුළ පවත්වන ලද ආරාධිත දේශන මාලා වැඩසටහන් යටතේ සහාය මහාචාර්ය ඇඩ්නේ වැලන් - සෙන්ස්ටැඩ් විසින් Human Dignity: A Dynamic Concept යන මැයෙන් දේශනයක් පවත්වන ලදී. මානව හිමිකම් හා බහුසංස්කෘතිකවාදය පිළිබඳ නව ශාස්ත්‍රපති පාඨමාලා හඳුන්වා දීම පිළිබඳ හමුවක් 2019 පෙබරවාරි 06 වෙනි දින ආයතනයේ දී පවත්වන ලදී. මෙම වැඩසටහනේ අරමුණ වූයේ නව ශාස්ත්‍රපති පාඨමාලා පිළිබඳ අවබෝධයක් ලබා දීමයි. තවද විභව්‍ය අයදුම්කරුවන්ට අධ්‍යයන ක්‍රියාවලියේ යෙදී සිටින ගුරුවරුන් හඳුනා ගැනීමට මෙමඟින් අවස්ථාව උදා වුණි.

ආයතනය විසින් මානව හිමිකම් හා බහුසංස්කෘතිකවාදය පිළිබඳ නව ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව 2019/20 අධ්‍යයන වර්ෂ වලදී ආරම්භ කරන ලදී. මෙම පාඨමාලාවේ සමාරම්භක රැස්වීම 2019 සැප්තැම්බර් 07 වෙනි දින ආයතනයේදී පැවැත්වුණි. මෙම පාඨමාලාව සඳහා අයදුම් 72 ක් ලැබුණු අතර, ශිෂ්‍යයින් 32 ක් බඳවා ගන්නා ලදී.



**කයිටෝ විශ්ව විද්‍යාලයේ ආසියානු හා අප්‍රිකානු කලාප අධ්‍යයන පිළිබඳ උපාධි පාසල.**

ජපානයේ කයිටෝ විශ්ව විද්‍යාලයේ ආසියානු හා අප්‍රිකානු කලාප අධ්‍යයන පිළිබඳ උපාධි පාසලත් මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයත් 2019 වර්ෂයේ දී අධ්‍යයන හුවමාරුව සහ සහයෝගීතාවය පිළිබඳ ගිවිසුමකට එළඹෙන ලදී. මෙම දෙපාර්ශවය පහත දැක්වෙන සුවිශේෂී ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීමට බලාපොරොත්තු වෙති.

1. විද්‍යාත්මක උපකරණ , ප්‍රකාශන හා තොරතුරු හුවමාරු කරගැනීම.
2. පීඨ සාමාජිකයින් හා පර්යේෂකයින් හුවමාරු කරගැනීම.
3. ශිෂ්‍යයින් හුවමාරු කරගැනීම .
4. ඒකාබද්ධ පර්යේෂණ හා පර්යේෂණ රැස්වීම්

ආයතන දෙක අතර සාකච්ඡාවකින් පසුව මෙම වැඩසටහන් ක්‍රියාවට නැංවීමට නියමිතය. මෙම හුවමාරු වැඩසටහන යටතේ පර්යේෂණයක් දියත් කිරීම සඳහා ආසියානු හා අප්‍රිකානු අධ්‍යයන පිළිබඳ උපාධි පාසලේ ශිෂ්‍යයෙකු මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත යොමු කර ඇත.

**මිනාන් බෞද්ධ විද්‍යාලය සහ අධ්‍යයන හුවමාරුව**

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා චීන ජනරජයේ මිනාන් බෞද්ධ විද්‍යාලය (BCM) අතර බෞද්ධ අධ්‍යන පාඨමාලා සම්බන්ධයෙන් අන්‍යෝන්‍ය සහයෝගීතා වැඩසටහන් ආරම්භ කරන ලදී. 2019 වර්ෂයේ දී මිනාන් බෞද්ධ විද්‍යාලය විසින් සිසුන් 13 දෙනෙකු ශාස්ත්‍රපති පාඨමාලා හැදෑරීම පිණිස මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත යොමු කරන ලදී. 2019 වසරේ ජුනි මාසයේදී මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය ආනන්ද ජයවික්‍රම මහතාත් ආගමික හා සංස්කෘතික මණ්ඩලයේ සභාපති වන මහාචාර්ය පූජ්‍ය එම්. ඥානානන්ද හිමිත් මිනාන් බෞද්ධ විද්‍යාලය වෙත ගියහ. එහිදී සාකාච්ඡාවට බඳුන් වූයේ ආයතන දෙක අතර ප්‍රවර්ධිත අධ්‍යාපනික, පර්යේෂණ හා සංස්කෘතික සහයෝගීතා පිළිබඳවය. මිනාන් බෞද්ධ විද්‍යාලයේ විදුහල්පති ශාස්ත්‍රපති අති පූජ්‍ය සි(Z) වූ හිමියන් සහ එහි කාර්ය මණ්ඩලය විසින් මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ධාරිතා සංවර්ධනයටත් විශේෂයෙන් ම විදේශීය සිසුන් සඳහා පහසුකම් වැඩි කිරීමටත් එකඟ වූණි.

2019 වසරේ අගෝස්තු 11 වෙනි දින මිනාන් බෞද්ධ විද්‍යාලයේ නියෝජිත පිරිසක් නව අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වූ ශිෂ්‍ය පිරිසක් සමඟ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයට පැමිණියහ. එම නියෝජිත පිරිසට පහත දැක්වෙන නිලධාරීන් ඇතුළත් විය.

- පූජ්‍ය ඩී. හොන්ග් හිමි - නැන්පුටෝ විහාරස්ථානයේ අධීක්ෂක (කණ්ඩායම් නායක)
- පූජ්‍ය ජයි සොන්ග් හිමි - මිනාන් බෞද්ධ විද්‍යාලයේ ජාත්‍යයන්තර අංශයේ අධ්‍යක්ෂ.
- පූජ්‍ය ජින්.ඇන් හිමි - මිනාන් බෞද්ධ විද්‍යාලයේ ශිෂ්‍ය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ.
- පූජ්‍ය Zසාහෝ යුඇන් හිමි - මිනාන් බෞද්ධ විද්‍යාලයේ අධ්‍යයන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ
- ආචාර්ය පූජ්‍ය Zසු ගොන්ග් හිමි - මිනාන් බෞද්ධ විද්‍යාලයේ ජාත්‍යයන්තර අංශයේ විධායක උප අධ්‍යක්ෂ

මෙම නියෝජිත පිරිසත්, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ හා ආයතනයේ ආගමික හා සංස්කෘතික අධ්‍යයන මණ්ඩලයේ නියෝජිත පිරිසක් අතර සාකච්ඡා පැවැත්වූණි. දෙපාර්ශවය විසින්ම ආයතන දෙක හා දෙරට අතර පවතින අධ්‍යයන සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම උදෙසා සම්පව කටයුතු කිරීමට එකඟතාවයකට එළඹෙන ලදී.

**ඇමරිකානු විශ්වවිද්‍යාලය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් වූ ආර්ථික විද්‍යාව**

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලා ආයතනය, ඇමරිකාවේ කොලොම්බියා දිස්ත්‍රික්කයේ (DC), වොෂින්ටන් නුවර පිහිටි ඇමරිකානු විශ්වවිද්‍යාලය (AU) හා එක්ව ආයතනය තුළ දැනට පවත්නා ආර්ථික විද්‍යා පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාවන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාව ප්‍රවේශයක් ලබාදීම සඳහා කටයුතු කරයි. එසේම ආයතන දෙක අතර සිදුකරන සහයෝගිතා අධ්‍යයන ක්‍රියාමාර්ග සහයෝගිතා ප්‍රත්‍යුත්ක්‍රම ගවේෂණය කරන අතර ඊට අදාළ පර්යේෂණයන් සිදු කරයි. 2018 වර්ෂයේ අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට අනුව හඳුනාගත් කර්තව්‍යයන් සාක්ෂාත් කරගැනීම උදෙසා ආයතන දෙක සමීපව කටයුතු කළහ. ආයතනය විසින් එහි පවත්නා ආර්ථික විද්‍යාව ශාස්ත්‍රපති පාඨමාලාවන්ට ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රවේශයක් ලබා දීම උදෙසා වූ පාඨමාලා 3 ක් හඳුන්වා දෙන ලදී. මෙම සහයෝගීතාවය යටතේ ස්විස්ට(ර්)ලන්තයේ Foundation Open Society ආයතනය මඟින් ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන් වලටත් විෂයමාලා සංවර්ධන වැඩසටහන් වලටත් මූල්‍යාධාර සපයන ලදී.




Gender Analysis in Economics @ Peradeniya (GAP) යනු මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සහ වොෂින්ටනයේ ඇමරිකානු විශ්වවිද්‍යාලය අතර පවත්නා අධ්‍යයන සහයෝගීතාවයකි. ආර්ථික විද්‍යාව පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාව පිළිබඳ විශ්ලේෂණ පාඨමාලාව (PGAE), ප්‍රතිපත්ති විශ්ලේෂකයින් හා විද්වතුන් බිහිකිරීම මඟින් ලොව පුරා සිටින කාන්තාවන් බලගන්වන වැඩසටහනකි. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙම පාඨමාලාවේ නියැලී සිටින කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා PGAE වැඩසටහන යටතේ ඇමරිකානු විශ්වවිද්‍යාලයේ සහාය ලැබුණි. එමඟින් අදාළ විශ්ලේෂකයින්ට හා උපදේශන කණ්ඩායම් වලට අවශ්‍ය පුහුණුව හා කුසලතා ලබාදීම තුළින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ප්‍රවර්ධනය උදෙසා කාර්යක්ෂමව ප්‍රතිපත්ති සම්පාදනය හා ඒවා ක්‍රියාවට නැංවීම අපේක්ෂා කරයි. එමෙන් ම මෙම ව්‍යාපෘතිය මඟින් අදාළ පාඨමාලාවන්ට අවශ්‍ය කරන දත්ත විශ්ලේෂක මෘදුකාංග මිලදී ගැනීම තුළින් ධාරිතා සංවර්ධනයට ද දායකත්වය සපයයි.

**M Give-a-Fig Volunteering සංවිධානය සමඟ අවබෝධතා ගිවිසුම (MOU)**

Give-A-Fig Volunteering (GAFV) සංවිධානය යනු එක්සත් රාජධානියේ (UK) ලියාපදිංචි (ලි.අ.10093433) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක් වන අතර, එය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි රාජ්‍ය නොවන සංවිධානයක් (NGO) වන Give-A-Fig Volunteering Sri Lanka (L-164604) සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කරයි. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය උක්ත සංවිධානය සමඟ අවබෝධතා ගිවිසුමකට පැමිණියහ.

GAFV සංවිධානය සහ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් ඇතිකර ගන්නා ලද සහයෝගීතා ක්‍රියාදාමයට දෙපාර්ශවයටම අදාළව පහත අධ්‍යයන ක්ෂේත්‍ර අන්තර්ගත වන අතර එම කටයුතු වලට පමණක් මෙම වැඩසටහන සීමා නොවේ.

1. පීඨ සාමාජිකයින් හා පර්යේෂකයින්ට අධ්‍යයන බැහැදැකීම් වලට පහසුකම් ලබාදීම හා ප්‍රවර්ධනය කිරීම.
2. පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ සිසුන් සමඟ සිදුකරන ක්ෂේත්‍ර කාර්යයන් , ක්ෂේත්‍ර අධ්‍යන වලට අවස්ථාව ලබාදීම සහ ඒකාබද්ධ පර්යේෂණ සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීම.

3. ශිෂ්‍ය හුවමාරුවට පහසුකම් සැලසීම.
4. ඒකාබද්ධ ජාත්‍යන්තර සමුළු/ සාකච්ඡා මුළු පැවැත්වීම.
5. ඒකාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති මෙහෙය වීම හා දැනුම ව්‍යාප්තිය සහ
6. අන්‍යෝන්‍ය අවබෝධය සහ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමට අදාළ අනෙකුත් කටයුතු වල නිරත වීම.

සිය සිසුන් සිදු කරන ක්ෂේත්‍ර කාර්යය සහ පර්යේෂණ දෙස් විදෙස් GAFV මධ්‍යස්ථානය හා පොදු ප්‍රජාව පදනම් කොට ගෙන සිදු කිරීමට මෙම සහයෝගීතාව උපයෝගී කර ගැනීමට ආයතනය සැලසුම් කරයි.

**ඉන්දියානු සාගර කලාපයේ අපදා අවදානම් අවම කිරීම හා කළමනාකරණය සඳහා වූ විශ්ව විද්‍යාල ජාලය.**

2019 වසරේදී The Vrije Universiteit Brussel (VUB) බ්‍රසල්ස් (ප්‍රධාන අයදුම්කරු) පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා අනෙකුත් විශ්වවිද්‍යාල/ ආයතන එක්ව යුරෝපියානු කොමිසම මඟින් අරමුදල් සපයන ශිෂ්‍ය හුවමාරු වැඩසටහන (Erasmus) + ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් වූ ශක්‍යතා සංවර්ධන ව්‍යාපෘතියට යෝජනාවන් ඉදිරිපත් කරන ලදි. විශ්වවිද්‍යාල ජාලයක් ලෙස එක්ව පුහුණු වැඩසටහන්, දැනුවත් කිරීමේ වැඩසටහන් හා පර්යේෂණ පැවැත්වීම තුළින් අදාල ව්‍යාපෘතිය සඳහා යොදා ගත් ඉන්දියානු සාගර කලාපයේ ශක්‍යතා සංවර්ධනය කිරීම මෙමඟින් සිදු කරයි. අයදුම්පත් 800 කට වඩා අධික සංඛ්‍යාවක් අතුරින් The Vrije Universiteit Brussel (VUB) සහ හවුල්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත අරමුදල් ලබා දීම සඳහා තෝරා ගනු ලබයි. මෙම ව්‍යාපෘතිය 2019 වර්ෂයේදී <u>ආරම්භ කරනු ලබයි</u>.

**අනෙකුත් විභව්‍ය සබඳතා**

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ කාර්යාලය හා එක්ව යෝජිත නාගරික හා ප්‍රාදේශීය සැලසුම් ශාස්ත්‍රපති පාඨමාලා ලබා දීම සඳහා විද්‍යාව පිළිබඳ චීන ඇකඩමිය සමඟ සහයෝගීතාවක් ගොඩ නඟා ගැනීම උදෙසා සාකච්ඡා ඇරඹීය. 2019 වර්ෂයේ අගෝස්තු 19 දින උක්ත කාරණාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා චීන නියෝජිත කණ්ඩායමක් ආයතනයට පැමිණියහ. දෙපාර්ශවය විසින් උක්ත කරුණ සම්බන්ධයෙන් ශිෂ්‍ය කාර්ය මණ්ඩල හුවමාරුව සහ පර්යේෂණ සහයෝගීතාවය ඉලක්ක කරගත් සබඳතාවන් ගොඩ නගා ගැනීමට එකඟ වුණි.

## 13 වෙනි කොටස සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය හා ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ උපාධි සිසුන්ට 2019 වර්ෂයේ ජුනි 22 දින අති උත්කර්ෂවත් අන්දමින් පවත්වන්නට යෙදුණු උපාධි ප්‍රදානෝත්සවයේ දී සිය සහතිකයන් ප්‍රදානය කරන ලදී. ආයතනයේ ශාස්ත්‍රපති, සංවර්ධන ක්‍රියාමාර්ග පිළිබඳ ශාස්ත්‍රපති, අධ්‍යාපනපති, දර්ශනපති හා දර්ශනශූරි යන උපාධි පාඨමාලාවන්හි යෙදුණු ශිෂ්‍යයෝ තුන්සිය හතළිස් තුන්දෙනෙක් (343) උපාධි ලබා ගත්හ.



ඉතිහාසයේ ප්‍රථම වතාවට මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පශ්චාත් උපාධි පාඨමාලා සම්පූර්ණ කරන ලද සිසුන් සඳහා ඩිප්ලෝමා ප්‍රධානෝත්සවයක් 2019 වර්ෂයේ පෙබරවාරි 16 වෙනි දින විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමන් ගේ ප්‍රධානත්වයෙන් එම ආයතනයේ දී පවත්වන ලදී. මෙම අවස්ථාවේ දී සිසුහු තුන්සිය තිස් දෙනෙක් පශ්චාත් උපාධි ඩිප්ලොමා සහතික ලබා ගත්හ.







## 14 වෙනි කොටස ධාරිතා සංවර්ධනය

සමාලෝචිත වර්ෂය තුළදී ආයතනය එහි පරිගණක විද්‍යාගාරය භාවිතා කිරීමේ අවකාශ පුළුල් කරන ලද අතර එහි පශ්චාත් උපාධි සිසුන් සඳහා අන්තර්ජාල පහසුකම් ලබා දෙන ලදී. තවද ආයතනය විසින් එහි කාර්යාල, සමුළු ශාලාව, අධ්‍යක්ෂ මණ්ඩල ශාලාව, කථිකාචාර්යවරුන්ගේ කාමර සහ පරිගණක විද්‍යාගාරයට අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ පරිඝණක, මුද්‍රණ යන්ත්‍ර වැනි උපකරණ ද මිලදී ගැනීම අඛණ්ඩව සිදුකොට ඇති අතර මණ්ඩල ශාලාවට සහ සමුළු ශාලාවට ශබ්ද විකාශන පද්ධති ස්ථාපිත කොට ඇත. ආයතනය විසින් ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිතව වියිමත් ක්‍රියාමාර්ග ගන්නා තුරු ශිෂ්‍යයින් සඳහා ආපනශාලා, පොදු කාමර පහසුකම් සැලසීම මෙන්ම ඡායා පිටපත්, මුද්‍රණ පිටපත් වැනි සහාය සේවා සැපයීමට ද තාවකාලික වැඩපිළිවෙලවල් යොදා ඇත.

ආයතනය වර්තමානයේ මුහුණදෙන ප්‍රධාන ගැටළුවක් වනුයේ ශිෂ්‍යයින්ට පොදු ශාලා, කියවීමේ කාමර, ආපනශාලා පහසුකම්, පරීක්ෂණාගාර සහ ඉගෙනුම් සහ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීමට මෙන්ම පරිපාලනමය කාර්යයන් සඳහා ප්‍රමාණවත් ඉඩකඩ පහසුකම් නොමැතිවීමයි. ආයතනය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඉදිරිපත් කරන ලද

ගොඩනැගිලි සම්බන්ධයෙන් වන යෝජනාවට අනුමැතිය ලබා ගැනීමේ ප්‍රයත්නය සමාලෝචිත වර්ෂය තුළදී ද අඛණ්ඩව සිදු කරන ලදී. නමුත් මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එවැනි යටිතල පහසුකම් තමන් විසින් උත්පාදිත අරමුදල්වලින් දැරිය යුතු බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අවධාරණය කිරීම හේතුකොටගෙන උක්ත ප්‍රයත්නය සඵල නොවී ය. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ එකී ප්‍රතිපත්තිය අවුරුදු 10 ක් හෝ ඊට වඩා වැඩි කාලයක් ක්‍රියාත්මක වුන පශ්චාත් උපාධි ආයතනයක් සම්බන්ධයෙන් උචිත වන නමුත් මූල්‍ය වර්ෂ 03 ක් තුළ පමණක් ක්‍රියාත්මක වී ඇති මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වැනි ආයතනයකට විශාල යටිතල පහසුකම් අවශ්‍යතා සඳහා ඉතිරි කිරීම් තුළින් අරමුදල් සම්පාදනය කර ගැනීම අතිශය අපහසු කරුණක් වී ඇත. පවත්නා ගොඩනැගිලි තුළ ප්‍රමාණවත් ඉඩකඩ සහ පහසුකම් නොමැතිවීම ආයතනයේ ඵලදායී මෙහෙයුම් ක්‍රියාවලියට මෙන්ම අනාගත සංවර්ධන සැලසුම්වලට ද බාධා එල්ල කරයි.

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන් විශේෂයෙන්ම විදේශීය සිසුන් මුහුණදෙන තවත් එක් ප්‍රධාන ගැටළුවක් වන්නේ නවාතැන් පහසුකම් නොමැතිවීමයි. ශිෂ්‍යයින් සඳහා සුදුසු සහ ආරක්ෂාකාරී නවාතැන් පහසුකම් නොමැති වීම ශිෂ්‍ය බඳවා ගැනීම් සම්බන්ධයෙන් අයහපත් බලපෑම් එල්ල කරයි. වර්තමානයේ බඳවා ගන්නා ලද විදෙස් ශිෂ්‍යයින් ප්‍රමාණය 25 ක් පමණ වන අතර, ඔවුන්ගෙන් බොහොමයක් අග්නිදිග ආසියානු රටවල සහ නැගෙනහිර ආසියානු රටවල බෞද්ධ භික්ෂූන් සහ භික්ෂුණීන් වේ. ඔවුන් භික්ෂු ශාසනයේ වීම හේතුවෙන් තිබෙන්නා වූ ඕනෑම නවාතැනක ලැගුම් ගැනීමට ඔවුනට හැකියාව නැත. සුදුසු සහ දරා ගත හැකි මුදලකට සපයා ගත හැකි නවාතැන් පහසුකම් විශ්වවිද්‍යාල තුළ හා ඒ අවට පවතින්නේ ඉතා සීමිත ප්‍රමාණයක් වන බැවින් විදේශීය ගිහි සිසුන්ට නවාතැන් පහසුකම් සැලසීම ද ගැටළුවක් වී ඇත. නවාතැන් පහසුකම් නොමැති වීම ආයතනයේ ශිෂ්‍ය - කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන් කෙරෙහි ද අයහපත් ලෙස බලපා තිබේ. උදාහරණයක් ලෙස මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ NORPART ව්‍යාපෘතිය යටතේ පැමිණි නෝර්වීජියානු ශිෂ්‍යයින් සුදුසු නවාතැන් පහසුකම් සොයා ගැනීමේ දී විශාල දුෂ්කරතාවලට මුහුණ දේ. දෛනිකව ගමනාගමනය අපහසු දුරබැහැර ප්‍රදේශවල සිට පැමිණෙන සිසුහු විශාල ප්‍රමාණයක් මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිටිති. ඔවුන්ට සති අන්තය ගත කිරීම සඳහා දරා ගත හැකි මුදලකට නවාතැන් පහසුකම් නොමැතිවීම ප්‍රධාන ගැටළුවකි. ගුරුවරුන්ට තම පංති ප්‍රමාද වී ආරම්භ කිරීමට සහ/ හෝ ශිෂ්‍යයින්ට තම නිවෙස් කරා යා හැකි වන පරිදි වේලාසනින් පන්ති අවසන් කිරීමට සිදු වීම ආයතනයේ ඉගැන්වීම් කටයුතු කෙරෙහි අයහපත් ලෙස බලපායි. නවාතැන් පහසුකම් ලබා දීමට නොහැකි වීම වැඩි දේශීය සහ විදේශීය සිසුන් ප්‍රමාණයක් බඳවා ගැනීම සම්බන්ධයෙන් අප දරන ප්‍රයත්නය දැඩි ලෙස බාධා පමුණුවන අතර, එමඟින් ආයතනයේ අනාගත සංවර්ධන සැලසුම්වලට ද බාධා පමුණුවයි.

ප්‍රධාන වශයෙන් ස්වයං මූල්‍යයනය හා පරිත්‍යාග ඔස්සේ යටිතල පහසුකම් සම්බන්ධයෙන් වූ ව්‍යාපෘතීන්හි ධාරිතා සංවර්ධනයට ආයතනය සැලසුම් යොදා ඇත. 2019 වසරේදී 1 අදියර යටතේ කාර්යාල හා අධ්‍යයන ගොඩනැගිලි සම්බන්ධයෙන් වූ යෝජනාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත අනුමැතිය සඳහා යවන ලදී. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පශ්චාත් උපාධි සිසුන් සඳහා නේවාසිකාගාරයක් ඉදි කිරීමට අවශ්‍ය මූල්‍යාධාර ලබා ගැනීම උදෙසා මිනාන් බෞද්ධ විද්‍යාලය සමඟ සාකච්ඡා අරඹන ලදී.

## 15 වන කොටස සාමාන්‍ය පරිපාලනය

මෙහෙයුම් කටයුතු හා සම්බන්ධ කළමනාකරණ හා කාර්යාවලි අඩුපාඩු / ගැටළු පිළිබඳ අවධානය යොමු කරමින් සාමාන්‍ය පරිපාලනය විධිමත් කිරීම සඳහා ආයතනය විසින් ක්‍රියාමාර්ග ගනු ලැබිය. ඇතැම් ගැටළු පූර්ව වර්ෂයේ විගණන විමසුම් වශයෙන් ඉදිරිපත් කර තිබුණි. මණ්ඩලය විසින් අනුමත අනු කමිටු, අනෙකුත් පරිපාලන ක්‍රියාකාරකම් හා අතුරු නීති වැඩසටහන් සඳහා වන නියාමන අවශ්‍යතා 2019 වර්ෂයේදී ක්‍රියාවට නංවනු ලැබිය. 2019 වර්ෂය තුළදී ආයතනයේ විගණන සහ කළමනාකරණ කමිටුව සිව්වරක් හා මුදල් කමිටුව සිව්වරක් රැස්වුණ. ආයතනය විසින් ස්ථාවර වත්කම් ලේඛනය සහ වත්කම් සැසඳුම් පිළියෙල කිරීමේ කටයුතු ද නිම කරන ලදී. ආයතනයේ ඉන්වෙන්ට්‍රි පොත පිළියෙල කිරීම වසර අවසානයේදී සම්පූර්ණ කරන ලද අතර, වත්කම්වල අගය සැසඳීමේ ක්‍රියාවලිය ද සම්පූර්ණ කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ ආයතනය සාමාන්‍ය පරිපාලනයේ දී සහ ආයතනය පවත්වාගෙන යාමේ දී සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කර තිබූ අතර එහි මූල්‍ය හා ගිණුම් කළමනාකරණයේ දී ද එවැනි ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි. එහි 2019 වර්ෂයේ කාර්යසාධනය පදනම් කරගෙන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ ගිණුම් සත්‍ය හා සාධාරණ බව (ලබා ගත හැකි විශිෂ්ටතම විගණන මතය) විගණන දෙපාර්තමේන්තුව විසින් වාර්තා කර තිබූ අතර මෙය වූ කලී ආයතනය විසින් එහි මෙහෙයුම් සිදු කළ මුල් වසර හතර තුළ ලබාගත් විශිෂ්ට ජයග්‍රහණයකි. කෙසේ වෙතත් එහි පවතින දුර්වලතාවලට තවදුරටත් පිළියම් යෙදීමටත් එම ලබාගත් ජයග්‍රහණ තහවුරු කිරීමටත් ආයතනය විසින් ක්‍රියාමාර්ග ගනු ලැබීය. ආයතනය එහි කළමනාකරණ මණ්ඩලයේ සහ අධ්‍යන මණ්ඩලවල සහ අනු කමිටුවල වැනි ආයතනයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය හා සම්බන්ධ ඒකකවල රැස්වීම 2019 වර්ෂය තුළදී ක්‍රමානුකූලව පැවැත් වුව ද නොවැළැක්විය හැකි බාධාවන් හේතුවෙන් අධ්‍යයන මණ්ඩලය මගින් අදාළ වසර සඳහා අවම වශයෙන් රැස්වීම 06 ක් පැවැත්වීමට අපොහොසත් වී ඇත.

මෙම කොටස මඟින් 2019 වර්ෂයේ දී ආයතනයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කෙරේ. 11 වැනි වගුවෙන් 2018 වර්ෂයේ හා 2019 වර්ෂයේදී ආයතනයේ මෙහෙයුම් ආදායම, මෙහෙයුම් වියදම සහ අතිරික්තය පිළිබඳ තොරතුරු නිරූපණය කෙරේ. ආයතනයේ මෙහෙයුම් ආදායම ශිෂ්‍යයින්ගෙන් ලබා ගන්නා ගාස්තු, පොළී ආදායම් සහ භාණ්ඩාගාරයෙන් ලැබෙන පුනරාවර්තන ප්‍රදානවලින් සමන්විත වේ. ආයතනයේ මෙහෙයුම් ආදායම 2018 වර්ෂයේදී රුපියල් මිලියන 108.045ක සිට 2019 වර්ෂයේදී රුපියල් මිලියන 131.923ක් දක්වා රුපියල් මිලියන 24කින් පමණ වර්ධනය වී තිබුණි. සිසුන්ගෙන් අයකරගත් මුදල් සහ ගාස්තු ප්‍රමාණය ඇතුළත් අභ්‍යන්තර ආදායම 2018 වර්ෂයේදී රුපියල් මිලියන 78.126ක සිට 2019 වර්ෂයේදී රුපියල් මිලියන 106.037ක් දක්වා වර්ධනය වී ඇත. නව උපාධි පාඨමාලා ආරම්භ කිරීම සහ පවත්නා වැඩසටහන් සඳහා ඇතුළත් කිරීම් ගාස්තු වැඩි කිරීම ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර ආදායම ඉහළ නැංවීමට දායක විය.

වගුව 11

ආයතනයේ මෙහෙයුම් ආදායම, වියදම සහ අතිරික්තය (2018 සහ 2019 වර්ෂ සඳහා)

| ආදායම / වියදම | 2018 | | 2019 | |
|---|---|---|---|---|
| | Rs. | % | Rs. | % |
| **මෙහෙයුම් ආදායම** | | | | |
| අභ්‍යන්තර ආදායම් (පාඨමාලා ගාස්තු ලියාපදිංචි, අධ්‍යයන, විභාග සහ පොලී ආදායම්) | 78,126,136.02 | 72.30 | 106,037,503.58 | 80.38 |
| පුනරාවර්තන ප්‍රදාන | 27,500,000.00 | 25.46 | 24,000,000.00 | 18.19 |
| රජයේ ප්‍රදානක්‍රමක්ෂය | 254,524.50 | 0.24 | 389,315.07 | 0.29 |
| පර්යේෂණ සමුළු ක්‍රමක්ෂය | 2,165,058.00 | 2.00 | 1,496,667.00 | 1.14 |
| ***මුළු මෙහෙයුම් ආදායම*** | **108,045,718.52** | **100.00** | **131,923,485.65** | **100.00** |
| | | | | |
| **මෙහෙයුම් වියදම** | | | | |
| පුද්ගල පඩිනඩි | 42,337,596.99 | 56.13 | 44,348,553.85 | 53.48 |
| ගමන් වියදම් | 1,155,194.00 | 1.52 | 933,174.92 | 1.13 |
| සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 2,081,218.55 | 2.74 | 2,677,420.51 | 3.23 |
| නඩත්තු | 18,768.00 | 0.02 | 274,370.30 | 0.33 |
| ගිවිසුම්ගත සේවා | 10,227,939.25 | 13.50 | 11,063,944.65 | 13.34 |
| ක්ෂය | 4,447,256.82 | 5.85 | 5,738,036.49 | 6.92 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 13,228,048.34 | 17.39 | 16,398,101.74 | 19.77 |
| පර්යේෂණ සමුළු වියදම් | 2,165,058.00 | 2.85 | 1,496,667.00 | 1.80 |
| ***මුළු මෙහෙයුම් වියදම්*** | **75,661,079.95** | **100.00** | **82,930,269.46** | **100.00** |
| | | | | |
| ශුද්ධ අතිරික්තය | **32,384,638.57** | **29.97** | **48,993,216.19** | **37.00** |


සටහන: ශුද්ධ අතිරික්තය මුළු මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස

මූලාශ්‍රය : මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය

10 වැනි වගුව සහ 4 වැනි රූපසටහන මඟින් ආයතනයේ මෙහෙයුම් පිරිවැය පිළිබඳ තොරතුරු ද නිරූපණය කෙරේ. පුද්ගල පඩිනඩි ගෙවීම්, ගිවිසුම්ගත සේවා සහ අනෙකුත් පුනරාවර්තන වියදම් ආයතනයේ මෙහෙයුම් පිරිවැයේ ප්‍රධාන සංරචකයන් වේ. පුද්ගල පඩිනඩි ගෙවීම් යන්නට ස්ථිර පරිපාලන කාර්ය මණ්ඩලය සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා වැටුප් සහ වේතන, බාහිර කථිකාචාර්ය ගාස්තු, අධීක්ෂණ ගාස්තු යනාදිය ඇතුළත් වේ. ගිවිසුම්ගත සේවා යන්නට ආරක්ෂක සේවා, පිරිසිදු කිරීමේ සහ පවිත්‍රතා සේවා සඳහා ගෙවීම්, වාහන කුළී, දුරකථන සන්නිවේදන සහ අන්තර්ජාල සේවා යනාදිය ඇතුළත් වේ. 2019 වර්ෂයේ දී ආයතනයේ මෙහෙයුම් වියදම රුපියල් මිලියන 82.930 ක් වශයෙන් පැවතුන අතර, එය 2018 වර්ෂයේ වාර්තා වූ රුපියල් මිලියන 75.661 ක මෙහෙයුම් වියදමට වඩා සියයට 10ක වැඩිවීමකි. පූර්ව වර්ෂය හා සැසඳීමේදී 2019 වර්ෂයේදී ගමන් වියදම් හා පර්යේෂණ වියදම් හැර සියළුම පිරිවැය සංරචක වැඩිවී තිබුණි. ආයතනයේ කර්තව්‍යයන් සහ මෙහෙයුම් පුළුල් වීම එහි මෙහෙයුම් පිරිවැය වැඩිවීම සඳහා හේතු වී තිබුණි.

රූපසටහන 4

2019 වර්ෂයේ මෙහෙයුම් පිරිවැයේ ප්‍රතිශතක ව්‍යාප්තිය




2018 වර්ෂය තුළ දී ආයතනය රුපියල් මිලියන 32.384 ක ශුද්ධ අතිරික්තයක් වාර්තා කරන ලදී. 2019 වර්ෂයේ දී ආයතනයේ ශුද්ධ අතිරික්තය රුපියල් මිලියන 48.993 ක් දක්වා රුපියල් මිලියන 16.5 කින් පමණ ඉහළ ගොස් ඇත. ආයතනයේ මුළු මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් ශුද්ධ අතිරික්තය 2019 වර්ෂයේ දී 37% කින් වර්ධනය වී ඇත.

ආයතනයේ 2018 වර්ෂයේ හා 2019 වර්ෂයේ මූල්‍ය තත්ත්වය 12 වන වගුව මඟින් නිරූපණය කෙරේ. ආයතනයේ ශුද්ධ වත්කම සහ හිමිකම 2018 වර්ෂයේදී රුපියල් මිලියන 105.693 ක සිට 2019 වර්ෂයේ දී රුපියල් මිලියන 158.501 ක් දක්වා ඉහළ ගොස් ඇත. ආයතනය 2018 සහ 2019 යන වර්ෂයන් තුළ එහි මෙහෙයුම් කටයුතුවලදී මනා මූල්‍ය කාර්යසාධනයක් සහ මූල්‍ය තත්ත්වයක් අත්කරගෙන ඇති බව ඉහත කරුණු අනුව පිළිබිඹු වේ. තවද, සමුච්චිත අතිරික්ත අරමුදල් නව අධ්‍යයන හා පරිපාලනමය හැකියාවන් ගොඩනැගීම සඳහා යොදා ගැනීමටත් සිසුන්ට වැඩි පහසුකම් හා දිරිගැන්වීම් ලබා දීමටත් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය තීරණය කර තිබේ. ශිෂ්‍යත්ව යෝජනා ක්‍රම නිර්මාණය කිරීම සහ පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය ස්ථාපිත කිරීම

මගින් සිය පර්යේෂණ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා මෙම අතිරික්ත අරමුදල් භාවිතා කිරීමටද ආයතනය සැලසුම් කරයි.

වගුව 12
2018 සහ 2019 වර්ෂයේ ආයතනයේ මූල්‍ය තත්ත්වය (දෙසැම්බර් 31 දිනට)

| අයිතමය | 2018 රු. | 2019 රු. |
|---|---|---|
| *වත්කම්* | | |
| ජංගම වත්කම් | 106,466,868.30 | 165,132,230.11 |
| ජංගම නොවන වත්කම් | 22,988,531.26 | 27,110,971.05 |
| **මුළු වත්කම්** | **129,455,399.56** | **192,243,201.16** |
| | | |
| *වගකීම්* | | |
| ජංගම වගකීම් | 22,489,823.87 | 30,941,565.89 |
| ජංගම නොවන වගකීම් | 1,425,818.00 | 2,800,564.00 |
| **මුළු වගකීම්** | **23,915,641.87** | **33,742,129.89** |
| | | |
| **ශුද්ධ වත්කම්** | **105,539,757,69** | **158,501,071.27** |
| | | |
| *හිමිකම්* | | |
| ප්‍රාග්ධන අරමුදල් | 13,465,098.10 | 16,575,783.03 |
| සමුච්චිත අරමුදල් | 52,063,568.54 | 83,091,040.11 |
| අනෙකුත් හිමිකම් සංරචක | 3,060,751.15 | 2,841,836.08 |
| අතිරික්තය | 32,384,638.57 | 48,993,216.19 |
| ප්‍රදාන- මිනාන් බෞද්ධ විද්‍යාලය | 4,565,701.33 | 6,999,195.86 |
| **ශුද්ධ හිමිකම්** | **105,539,757.69** | **158,501,071.27** |

මූලාශ්‍රය : මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය අංශය

## 17 වන කොටස විභවතා සහ අපේක්ෂා

පවත්නා පාඨමාලා සඳහා වන ප්‍රවේශය තවදුරටත් පුළුල් කරමින් සහ අන්තර් විෂයික සහ බහු විෂයික සංකල්පය තුළ නව පාඨමාලා හඳුන්වා දෙමින් පශ්චාත් උපාධි පාඨමාලා පුළුල් කිරීමට සහ විවිධාංගිකරණය කිරීමට ආයතනය සැලසුම් කරයි. සංයුක්ත සැලැස්මේ හඳුන්ගෙන ඇති පරිදි සහ අවශ්‍යතා මතුවන පරිදි නව උපාධි පාඨමාලා සකස් කිරීමේ කාර්යයෙහි ආයතනය අඛණ්ඩව නියැලී සිටී. එමෙන්ම පෞද්ගලික හා රාජ්‍ය ආයතනවල සහයෝගයෙන් යුතුව ශ්‍රම බලකාය සඳහා කෙටි කාලීන පාඨමාලා පැවැත්වීම ද ආයතනය විසින් සිදු කරනු ලබයි.

ආයතනය පොදුවේ තම ශිෂ්‍යයින්ගේ සහ අනෙකුත් පිරිසගේ පර්යේෂණ සහ කාර්ය ධාරිතාවය සංවර්ධනය කිරීම උදෙසා වාර්ෂික සමුළු, පරිසංවාද, වැඩමුළු සහ පුහුණු සැසි අඛණ්ඩව පවත්වයි. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ජර්නලයේ තම පර්යේෂණ ප්‍රකාශන එළ කිරීම සඳහා පශ්චාත් උපාධි ශිෂ්‍යයින් සහ පර්යේෂකයින් උනන්දු කරවීම ද සිදු කෙරේ.

ඵලදායී සහ ඉහළ මට්ටමකින් යුත් පර්යේෂණ පවත්වාගෙන යාමටත් ඒවා පල කිරීමට හා ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසමින් පශ්චාත් උපාධි සිසුන් විසින් ආරම්භ කරන ලද පර්යේෂණ දිරිමත් කිරීමට සහ ඒ සඳහා සහාය ලබා දීම පිණිස වැඩි වැඩියෙන් සම්පත් සහ පහසුකම් සලසා දීම කෙරෙහි ආයතනය සිය අවධානය යොමු කරයි. දේශීය සහ/ හෝ විදේශීය පුද්ගලයින්, කණ්ඩායම් සහ කීර්තිමත් සංවිධාන සමඟ උසස් අධ්‍යාපනය සහ පර්යේෂණ සම්බන්ධයෙන් ඵලදායී සම්බන්ධතා ගොඩ නඟා ගනිමින් පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් හි ආයතනය දැනට නියැලී සිටින ප්‍රමාණය තවදුරටත් පුළුල් කිරීමට එම ප්‍රයත්නයෙන් අපේක්ෂා කරයි. උපාධි පාඨමාලාවල සහ පර්යේෂණවල ගුණාත්මකභාවය තවදුරටත් ඉහළ නැංවීම පිණිස අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ නියෝජිත ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය සහ අනෙකුත් උසස් අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතන වැනි දේශීය ආයතන සමඟ සබඳතා සහ සහයෝගීතා ස්ථාපිත කිරීමද සිදු කරනු ඇත. විදේශ ආයතන සමඟ සබඳතා සහ සහයෝගීතා ගොඩනැඟීම ආයතනයට තම පාඨමාලා ජාත්‍යන්තරීකරණය කිරීම සඳහා මඟ පාදන අතර විදෙස් පුහුණු සඳහා අවස්ථා උදා කර ගැනීමට එහි සිසුන්ට අවස්ථාව සැලසේ. 2018-22 කාලපරිච්ඡේදය සඳහා වන සංයුක්ත සැලැස්ම සහ ඒ අනුව පිළියෙල කරනු ලබන ක්‍රියාකාරී සැලසුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීම මඟින් ආයතනය මෙරටේ මෙන්ම කලාපයේ උසස් අධ්‍යාපන හා පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛස්ථානයට ඔසවා තැබීමට අපේක්ෂා කෙරේ.

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } සීඑල්පී/කේඩී/ජේ/පීජීඅයිඑච්එස්/ 2020/09
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2020 ජූනි 19 දින

අධ්‍යක්ෂ,

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2. මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ

බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීති,රීති / විධානයට යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | 2015 අප්‍රේල් 09 දිනැති අංක 914 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස්වීමේදී අනුමත, අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ආචාර ධර්ම හා අධ්‍යයන වගකීම් පිළිබඳ මාර්ගෝපදේශයේ 5 වන වගන්තිය | ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයින් අතර ද්වි සම්බන්ධතා (Dual Relationship with Students) අනාවරණය කර ගැනීමට හෝ මේ මඟින් තත්ත්ව පාලනයට ඇති විය හැකි අහිතකර තත්ත්වයන් වළක්වා ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් පිළියෙල කර පවත්වාගත යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2009 ජූනි 09 දිනැති අංක DMA/2009(II) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 09 ඡේදය | සෑම අභ්‍යන්තර විගණන ඒකකයක්ම තම ආයතනය වෙනුවෙන් කාර්තුවකට වරක් අභ්‍යන්තර විගණන වාර්තාවක් පිළියෙල කර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

(ඇ) 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය සහ වැඩි දියුණු කිරීම සහ ස්ථාවර වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් රු. මිලියන 14 ක් ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා කිසිදු මුදලක් වැය කර නොතිබුණි.

(ආ) 2019 ජනවාරි 01 දින ආරම්භ කර තිබූ ආයතනයේ පිවිසුම් මාර්ගය පුළුල් කිරීම හා වාහන ගරාජයක් ඉදිකිරීමේ රු. 1,329,975ක් වටිනා කොන්ත්‍රාත්තුව 2019 මැයි 27 දින වන විට අවසන් කිරීමට නියමිතව පැවතියද, 2019 දෙසැම්බර් 31 වන දින වන විටත් අවසන් කර නොතිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂන

(අ) Minan Buddhist College China ආයතනයෙන් ප්‍රදාන වශයෙන් 2017 දී රු.2,150,896 ක්, 2018 දී රු.2,414,805 ක් හා 2019 දී රු.2,433,495 ක් වශයෙන් ලැබී තිබූ එකතුව රු.6,999,196 ක් ආයතනයේ සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට සැලසුම් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර ස්ථාවර තැන්පත්වල ආයෝජනය කර තිබූ අතර ඉන්දු ශ්‍රී ලංකා පදනම මඟින් පර්යේෂණ කටයුතු සඳහා 2017 වර්ෂයේදී ලැබී තිබූ රු.368,125 ක මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් උපයෝජනය කර නොතිබුණි.

(ආ) 2019 දෙසැම්බර් 31 දිනට තොග සමීක්ෂණය අනුව වටිනාකම රු.208,840 ක් වූ මාදිලි 04 කට අයත් ටෝනර් 17 ක් හා Riso Master Roll 04 ක් චලනය නොවන තොග ලෙස හඳුනාගෙන තිබුණි. එසේම රු.477,522 ක් වූ ලිපි ද්‍රව්‍ය ඇතුළු තොග වර්ග 10 ක් සෙමින් චලනය වන තොග ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව තොග සම්බන්ධයෙන් පවතින අභ්‍යන්තර පාලන ක්‍රමය ඵලදායී නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) අයවැයගත වියදම් හා සත්‍ය වියදම් සමග සැසඳීමේදී වියදම් විෂයයන් 02 ක සියයට 38 ක හා සියයට 296 ක වැඩි වීමක්ද, වියදම් විෂයයන් 15 ක සියයට 20 සිට සියයට 94 දක්වා වියදමේ අඩු වීමක්ද නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය ආරම්භයේදී රු.477,157 ක් වූ අරමුදල් ගිණුම් 02 ක වර්ෂය තුළ උපයෝජනය නොකර නිෂ්කාර්ය ලෙස පවත්වාගෙන ගොස් තිබුණි.

(ඉ) Preparation and Planning for Gender Analysis in Economics at UOP ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.756,449 ක ශේෂය ජර්නල් සටහනක් මඟින් මෘදුකාංග මිලදී ගැනීමේ ගිණුමට මාරු කර ඇතත්, අදාළ මෘදුකාංග මිලදී ගැනීමට වර්ෂය තුළ කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ එළි දැක්වීමේ උත්සවය (Research Congress) සඳහා දරන ලද රු. 1,357,167ක වියදම වර්ෂයේ වියදම් ලෙස සටහන් නොකර ඍජුවම සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2020 ඔක්තෝබර් 07

සහකාර විගණකාධිපති,
සහකාර විගණකාධිපති කාර්යාලය,
විදුලිබල අමාත්‍යාංශ ගොඩනැගිල්ල,
යටිනුවර වීදිය,
මහනුවර.

**සි.එල්.පී./කේ.ඩී/ජේ/පී.ජී.අයි.එච්.එස්/2020/09**
**මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව අවසන් විගණකාධිපති වාර්තාව හා බැඳේ.

ඔබ විසින් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලබා දුන් විගණන වාර්තාවේ සඳහන් කරුණු පිළිබඳව තවදුරටත් පැහැදිලි කිරීම සඳහා මෙම පිළිතුරු ඉදිරිපත් කරනු ලබන අතර පිළිතුරු සනාථ කිරීමට ප්‍රමාණවත් ලිපිලේඛන, වාර්තා සටහන් යනාදියෙහි පිටපත් මේ සමඟ අමුණා ඇත.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

(අ) ආයතනය සඳහා වෙනම ආචාර ධර්ම හා අධ්‍යයන වගකීම් පිළිබඳ මාර්ගෝපදේශයන් නොමැති අතර ආයතනය දැනට පේරාදෙණිය විශ්වවිද්‍යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ආචාර ධර්ම හා අධ්‍යයන වගකීම් පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුගතව කටයුතු කරනු ලබයි. එසේම ආයතනයේ ඉගැන්වීම සිදුකරන සෑම ආචාර්යවරයෙකුටම/වරියකටම ලබාදෙනු ලබන පත්කිරීමේ ලිපියෙන් සහ අදාළ සේවා කොන්දේසි වලින් (Terms of References) මෙම ආචාරධර්මවලට අනුකූලව කටයුතු සිදුකළ යුතු බවට දක්වා ඇත. (ඇමුණුම 02).
කෙසේ වුවද ආයතනයේ 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ආයතනය විසින් අත්පත් කරගත යුතු එක් අවශ්‍යතාවයක් ලෙස මෙම ආචාර ධර්ම හා අධ්‍යයන වගකීම් පිළිබඳ මාර්ගෝපදේශයන් හඳුනාගෙන ඇති අතර මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා 2020 වර්ෂය තුළදී ආයතනය විසින් සියලු කටයුතු සිදු කිරීමට අපේක්ෂිතය.

(ආ) මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ආරම්භ කළ දින සිට අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කොට නොතිබුණි. ඒ අනුව අදාල කාර්යය මණ්ඩලය සමඟ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීම සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය මේ වන විටත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත. කෙසේ වුවද, විධිමත් නොවන පරිදි මේ දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශයෙන් අවශ්‍ය

විගණන කටයුතු සඳහා සේවය ලබාගත් අතර ඔවුන්ට ප්‍රමාණවත් මානව සම්පත ලබා නොදීම මත විධිමත් විගණන සැලැස්මක් මත DM/2009 (i) කළමණාකරණ චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට නොහැකි වී ඇත.

එසේම, පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතනයන් වෙනම ස්වාධීනව ස්ථාපිත වූ ආයතන ලෙස කටයුතු කරන බැවින් විගණනය සම්බන්ධව විධිමත් බලය පැවරීමක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය වෙත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පවරා නොතිබීම මත ඔවුන්ටද චක්‍රලේඛ පරිදි විගණන කටයුතු කිරීමට හැකියාවක් නොමැති බව දන්වා සිටිමි.

මේ පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සලකා බැලීමෙන් අනතුරුව 2019.01.01 දිනැති 01 - 2019 දරණ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛ මගින් අනුබද්ධ ආයතන හා විශ්වවිද්‍යාල මණ්ඩප (Institute/ Campus) වල අභ්‍යන්තර විගණන කටයුතු එම අනුබද්ධ ආයතනය සම්බන්ධ වූ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් කළ යුතු බව දක්වා ඇති අතර අවශ්‍ය කාර්යය මණ්ඩලයද ලබා දීමට කටයුතු කරන බව දන්වා ඇත. ඒ අනුව අවශ්‍ය කාර්යය මණ්ඩලය අනුයුක්ත කළ පසු විධිමත් පරිදි අභ්‍යන්තර ඒකක පිහිටුවා විධිමත් පරිදි විගණන කටයුතු කිරීමට හැකි බව දන්වමි.

එසේම මේ සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විගණන කමිටුවෙන් අවධානය යොමු කර ඇති අතර කාර්යය මණ්ඩල අවශ්‍යතාව මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට යොමු කර එම නිර්දේශ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයන්ද සහිතව අවශ්‍ය කාර්ය මණ්ඩල ලබාගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.

තවද, ඉහත චක්‍රලේඛය කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවෙන් 12.01.2019 දිනැති DMA 01-2019 දරණ චක්‍රලේඛය මගින් අවලංගු කර ඇති අතර නව නිර්දේශ එමගින් ලබා දී ඇත. එසේම එම චක්‍රලේඛය මේ දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අන්තර්ග්‍රහණය කර නොමැත.

(ඇ) ආයතනය විසින් දැනට මෙහෙයවනු ලබන ඉගැන්වීමේ හා පර්යේෂණ වැඩසටහන් සහ පාඨමාලා සංවර්ධනය අංක NP/SP/SDG/IA දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රයේ අඩංගු සියලු අරමුණු වලට අනුකූලව සිදු වේ. එසේම ආයතනය විසින් දැනට සිදුකරගෙන යන පර්යේෂණ කටයුතු විශේෂයෙන්ම පහත දැක්වෙන තිරසාර අරමුණු වලට අනුගත වන අතර (අරමුණු: 1, 2, 3, 4, 5, 6, 8, 9, 10, 12, 13, 15 සහ 16) ආයතනයේ නව අධ්‍යයන වැඩසටහන් සහ පාඨමාලා සංවර්ධනය විශේෂයෙන් පහත දැක්වෙන අරමුණුවලට අනුගත වේ. (අරමුණු: 1, 4, 5, 11, 13, 15 සහ 16)

ආයතනයේ තිරසාර අරමුණු ලඟා කරගැනීම සම්බන්ධව කෙටුම්පත් කළ සැලැස්ම 2019 දෙසැම්බර් මස 20 වැනි දින පැවති ආයතනයේ 31වන කළමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කල අතර මේ සම්බන්ධව දීර්ඝව සාකච්ඡා කළ කළමනාකරණ මණ්ඩලය මෙම කෙටුම්පත අනුමත කළ අතර එය වැඩිදියුණු කිරීම සඳහා ආයතනයේ අධ්‍යයන මණ්ඩල ප්‍රධානීන් සහ කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු පත්කළ අතර එහිදී හඳුනාගන්නා වෙනස්කම් සහිතව නැවත කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අධ්‍යක්ෂවරයා වෙත දැනුම්දෙන ලදී. මේ සම්බන්ධයෙන් ආයතනය මේ වනවිට කටයුතු සිදුකරගෙන යනු ලබයි.

එසේම ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජික ආචාර්ය ජේ. එම්. ගුණදාස මහතා ආයතනයේ සේවකයන්ගේ තිරසාර සංවර්ධනය පිළිබඳ දැනුම ඉහළ නැංවීම සඳහා සහ

ආයතනයක් ලෙස තිරසාර සංවර්ධන අරමුණු ලඟා කරගන්නේ කෙසේද යන මැයෙන් 2019 ඔක්තෝබර් මස 20 වන දින වැඩමුළුවක්ද පවත්වන ලදී.

(අ) 2019 වර්ෂය මිලදී ගැනුමට සැලසුම් කළ ඇස්තමේන්තු කරනලද වටිනාකම රු. මිලියන 10ක් වන ස්ථාවර වත්කම් වලට කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි (Management Information System), ආයතනය වෙනුවෙන් SPSS මෘදුකාංගය මිලදී ගැනීම, ආයතනයේ භාෂා විද්‍යාගාරය ආරම්භ කිරීම සහ ආයතනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය පුස්තකාලය ආරම්භ කිරීම අයත් විය.

කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි (Management Information System) අවශ්‍යතා හඳුනාගැනීම සඳහා අවශ්‍යය කටයුතු සිදු කරනු ලැබිණි. මේ සඳහා ආයතනයේ සියලුම අංශ කෙරෙහි අවධානය යොමු කරමින් අවශ්‍යය තොරතුරු ලබාගත් අතර මෙම කටයුත්ත අධ්‍යයනය කිරීම සඳහා සැලකියයුතු කාලයක් ගතවිය. මේ වනවිට ආයතනයට අදාළ සියලු අවශ්‍යතා හඳුනාගැනීම් සිදුකර අවසන්ව ඇති අතර 2020 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට මෙම අයිතමය ඇතුළත් කර ඇත. 2020 වර්ෂයේදී මෙය මිලදීගෙන අවසන්කිරීමට බලාපොරොත්තු වේ.

SPSS මෘදුකාංගය මිලදී ගැනීම සඳහා 2019 මාර්තු මසදී මිල කැඳවීම් සිදු කළ අතර ඒ සඳහා එක් ලන්සුකරුවෙකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මෙම මිල ගණන් ආයතනය ඇස්තමේන්තු කළ මිල ගණන් වලට වඩා ඉතා විශාල අගයක් ගත් අතර තාක්ෂණික ඇගයීම් කමිටුවේදී සහ ප්‍රසම්පාදන කමිටුවේදී මෙම මිලගණන් ගැන සැලකිලිමත් වෙමින් නැවතත් එම මෘදුකාංගයේ පිරිවිතර (Specifications) ඉතා නිවැරදිව අධ්‍යයනය කරමින් අවශ්‍යතාවය අනුව නැවතත් මිලගණන් කැඳවීමට තීරණය කරන ලදී. එසේම දේශීය සැපයුම්කරුවන්ගෙන් පමණක් නොව සෘජුව මෘදුකාංගය නිෂ්පාදකයාගෙන් හෝ විදේශීය සැපයුම්කරුවන්ගෙන් ලන්සු කැඳවීම කෙරෙහිද අවධානය යොමු කරන ලෙස ප්‍රසම්පාදන කමිටුව විසින් උපදෙස් ලබාදෙන ලදී. මේ අනුව නැවත මෙම මෘදුකාංගය මිලදී ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරනු ලැබේ.

ආයතනයේ භාෂා විද්‍යාගාරය ආරම්භ කිරීම වෙනුවෙන් 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙන් මුදල් වෙන්කර තිබුණද එම අවශ්‍යතාවය ආයතනයේ ඉතාමත් ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට අවශ්‍යය නොවන කටයුත්තක් ලෙස පසුව හඳුනාගෙන තිබිණි. මේ කරුණ හේතුවෙන් ආයතනය මෙම අවශ්‍යතාවයද ඉදිරි වර්ෂයකදී සපුරා ගැනීමට අවශ්‍ය කටයුතු යොදනු ලැබේ.

ආයතනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය පුස්තකාලය 2019 වර්ෂයේදී ආරම්භ කර ඇත. ඒ සඳහා අවශ්‍ය ශ්‍රව්‍ය හා දෘශ්‍ය ආධාරක පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සහ අනෙකුත් දායකයන්ගෙන් නොමිලයේ ආයතනය වෙත ලැබුණු අතර ඒවා භාවිතා කරමින් දැනට ආයතනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය පුස්තකාලය පවත්වාගෙන යනු ලබයි. මෙය ආරම්භ කිරීම වෙනුවෙන් 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මෙන් මුදල් වෙන්කර තිබුණද මේ අවස්ථාව වන විට එම මුදල් භාවිතා කර පුස්තකාලය වෙනුවෙන් ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් මතු නොවිනි. ඉදිරියේදී පුළුල් වන අවශ්‍යතා අනුව හඳුනාගන්නා අනෙකුත් ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු යොදනු ලැබේ.

(ආ) ආයතනයේ පිවිසුම් මාර්ගය පුළුල් කිරීමේ කොන්ත්‍රාත්තුව ලබාගත් කොන්ත්‍රාත්කරුගේ වැඩ අධීක්ෂණය සිදු කරනු ලැබුවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වැඩ අංශය විසිනි. කොන්ත්‍රාත්කරු විසින් අදාළ කොන්ත්‍රාත්තුවේ කොටසක් නිම කර එම කොටස සඳහා බිල්පතක් 2019 අප්‍රේල් 02 වන දින ආයතනය වෙත යොමු කළ අතර එය මෙම ආයතනය විසින් 2019 අප්‍රේල් 06 දින විශ්වවිද්‍යාලයේ වැඩ ඉංජිනේරුවරයා වෙත යොමු කෙරිණි. නමුත් විශ්වවිද්‍යාලයේ වැඩ දෙපාර්තමේන්තුවේ පැවති පරිපාලනමය ගැටළු තත්වයන් නිසා

කොන්ත්‍රාත්කරු විසින් සිදු කළ වැඩ ඇගයීමේ කටයුතු ප්‍රමාද වූ අතර (2019 අගෝස්තු 01 දින දක්වා) අමතර වැඩ කටයුතු වෙනුවෙන් ගෙවීම් අනුමත කිරීමද බොහෝ දිනකින් ප්‍රමාද විය. මෙම හේතු මත කොන්ත්‍රාත්කරුට මුදල් ගෙවීම ප්‍රමාද වූ අතර කොන්ත්‍රාත්කරු විසින් මෙම ගෙවීම් කටයුතු සිදු කරන තෙක් නැවත මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීම ප්‍රමාද කරන ලදී. (අමතරව සිදුකළ වැඩකටයුතු සඳහා ගෙවීම් අනුමැතිය ලැබුණු දිනය 2019 දෙසැම්බර් 30). මෙම හේතු නිසා අදාළ කොන්ත්‍රාත්තුව නියමිත දිනට අවසන් කිරීමට නොහැකි විය.
කෙසේ වෙතත් නව වැඩ ඉංජිනේරුවරයා පත් වීමත් සමඟ වැඩ දෙපාර්තමේන්තුවේ පැවති පරිපාලනමය ගැටළු තත්වයන් සමනය වූ අතර මේ වන විට කොන්ත්‍රාත්කරුට අදාළ ගෙවීම් සිදුකරන ලදී. කොන්ත්‍රාත්කරු විසින් නිම කරන ලද අමතර වැඩ කටයුතු අනුමත කිරීමට සහ ඒ වෙනුවෙන් ගෙවීම් කටයුතු සිදු කිරීමට වැඩ ඉංජිනේරුවරයා එකඟ විය.
මේ වන විට කොන්ත්‍රාත්කරු විසින් අදාළ ගිවිසුම් සහ ඇපකර වල ගිවිසුම්ගත කාලයන් දීර්ඝ කළ අතර කොන්ත්‍රාත්තුවේ ඉතිරි වැඩකටයුතු ආරම්භ කර ඇත. ඉතාමත් ඉක්මනින් මෙම කොන්ත්‍රාත්තුව නිම කර අවසන් කිරීමට ආයතනය වැඩකටයුතු සිදු කරනු ලබයි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) චීනයේ මිනාන් බෞද්ධ විද්‍යාලය (Minan Buddhist College, China) මගින් තුන්වරකදී අදාළ මුදල් පරිත්‍යාග කරනු ලැබුයේ ආයතනයේ සංවර්ධන කටයුතු සඳහා යොදාගැනීමටය. කෙසේ වුවත් ආයතනය විසින් මෙම මුදල් ශිෂ්‍ය නේවාසික ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කිරීම සඳහා යොදා ගැනීමට තීරණය කළ අතර එම ගොඩනැගිල්ල ඉදිකිරීමේ මූලික වැඩ කටයුතු සකස් කරන තෙක් එම මුදල් ස්ථාවර ගිණුමක තැන්පත් කිරීමට තීරණය කර ඇත. මේ වනවිටත් අදාළ ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ කටයුතු කරමින් සිටින අතර එහි ඉදිකිරීම් කටයුතු 2020 වසර තුළ ආරම්භ කිරීමට බලපොරොත්තු වේ.
මානවශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා ඉන්දු ශ්‍රී ලංකා පදනම එක්ව සිදු කරන පර්යේෂණයහි 2019 වසර තුළ දත්ත එකතු කිරීමේ මූලික ක්‍රියාවලිය පමණක් සිදු කළ හෙයින් 2018 හා 2019 වසර තුළදී කිසිදු වියදමක් දරා නොමැත. කෙසේවුවත්, මෙම ව්‍යාපෘතියේ කාල රාමුව දීර්ඝ කර ගැනීම සඳහා ඉන්දු ශ්‍රී ලංකා පදනමට අප ආයතනය මගින් විද්‍යුත් තැපැල හරහා සිදු කරන ලද ඉල්ලීමට මේ දක්වා පිළිතුරක් ලබා දී නොමැත.

(ආ) මිලදී ගෙන නිකුත් නොකර තිබූ තොග ආයතනයේ ඇති ඡායාපිටපත් යන්ත්‍රයකට සහ ෆැක්ස් යන්ත්‍රය සඳහා ලබා ගත් ටෝනර් වර්ග ඉතා සෙමෙන් ක්ෂය වන අයිතමයක් ලෙස හඳුනා ගෙන ඇති අතර රෝනියෝ කඩදාසි එකවර 500ක තොගයක් මිලදී ගෙන ඇත්තේ මිලදී ගැනීමේ පිරිවැය අඩු කර ගැනීමේ අරමුණ සහිතවය. ඉදිරියේදී මෙවැනි අයිතමයන් මිලදී ගැනීමේදී මීට වඩා සැලකිල්ලක් යොමු කර වාර්ෂික අවශ්‍යතා අනුව මිලදී ගැනීමට කටයුතු යොදනු ලැබේ.

(ඇ) ආයතනයේ ඇතැම් කටයුතු විවිධ බාහිර සාධක මත රඳා පවතින බැවින් එම කටයුතුවල වියදම් 100% ක් කිරීම නිවැරදිව පුරෝකථනය කිරීමට අපහසුය. එවැනි තත්වයන් නිසා ඇතිවන අවදානම අඩු කිරීම සඳහා සාමාන්‍යයෙන් සිදු කරනුයේ තරමක අධි ඇස්තමේන්තුගත කිරීමකි. මේ නිසා අයවැයගත වියදම් හා සත්‍ය වියදම් සමග සැසඳීමේදි යම් සත්‍ය වියදම් වල වැඩි වීමක් හෝ අඩු වීමක් දක්නට ලැබේ. මෙම කටයුතු සම්බන්ධයෙන් වඩාත් නිවැරදි පුරෝකථන කිරීමට ඉදිරියේදී කටයුතු කෙරේ.

(ඈ) ඉන්දු ශ්‍රී ලංකා පදනම එක්ව සිදු කරන පර්යේෂණ අරමුදලහි සහ අධ්‍යක්ෂ අරමුදලහි වර්ෂය තුළ කිසිදු ගනුදෙනුවක් නොකර රු. 477,157 ක මුදලක් පවත්වාගෙන ගොස් ඇති අතර 2020 වර්ෂය තුළ මෙම අරමුදල් ගනුදෙනු සඳහා යොදා ගනු ලැබේ.

(ඉ) මෘදුකාංග මිලදී ගැනීම සඳහා වෙන් කර ඇති රු. 756,449 ක මුදල භාවිතා කර අදාල මෘදුකාංග මිලදී ගනීම සඳහා කටයුතු මේ වන විටත් සිදු කර ඇත.

(ඊ) 2020 වර්ෂයේ සිට පර්යේෂණ එළි දැක්වීමේ උත්සවය සඳහා වන වියදම් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කරනු ලැබේ. ඒ අනුව අදාල ඇස්තමේන්තු සකස් කොට ඇත.

අධ්‍යක්ෂ
මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පිටපත්
1. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
2. විගණන අධිකාරී, රජයේ විගණන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
3. නියෝජ්‍ය අභ්‍යන්තර විගණක අභ්‍යන්තර විගණන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය